මානුෂීය සේවායතන සමූහය

අප්‍රේල් 2009

# ක්ෂණික තතු විමසුම - (Rapid Context Assessment )

CONSORTIUM OF CHA HUMANITARIAN AGENCIES (GTE) LIMITED
ISO 9001 REGISTERED DNV MGMT. SYS. RvA C 024 DNV Certification B.V., The Netherlands

### ජාතික විශ්ලේෂණය

| | |
|---|---|
| දේශපාලනය | 2 |
| පාලනය | 2 |
| ආරක්ෂක තත්ත්වය | 2 |
| මානව හිමිකම් | 3 |
| ආර්ථික සන්දර්භය | 3 |
| පරිසරය | 4 |
| සිවිල් සමාජය හා මාධ්‍ය අවකාශය | 4 |
| මානුෂිය හා සංවර්ධන අවකාශය | 4 |
| බාහිර ක්‍රියාකාරීන් | 5 |

### දිස්ත්‍රික්ක විශ්ලේෂණ

| | |
|---|---|
| අම්පාර | 5 |
| මඩකලපුව | 6 |
| කොළඹ | 6 |
| යාපනය | 6 |
| මන්නාරම | 7 |
| ත්‍රිකුණාමලය | 7 |
| වව්නියාව | 7 |

### ප්‍රවනතාවන් විශ්ලේෂණය කිරීම

| | |
|---|---|
| දේශපාලන සංදර්භය | → |
| පාලනය | ↘ |
| ආරක්ෂක තත්ත්වය | → |
| මානව හිමිකම් | → |
| ආර්ථික සන්දර්භය | ↘ |
| පරිසරය | → |
| සිවිල් සමාජය හා මාධ්‍ය අවකාශය | ↗ |
| මානුෂිය හා සංවර්ධන අවකාශය | ↘ |
| බාහිර ක්‍රියාකාරීන් | ↘ |

දර්ශකය

# සාරාංශය



බස්නාහිර පළාතේ එක්සත් ජනතා නිදහස් සංධානය ජය ගැනීමත් සමග රජය තව දුරටත් දේශපාලන වශයෙන් ශක්තිමත් වී තිබේ. මැතිවරණය හා නිදහස් හා සාධාරණ වුවද මැතිවරණ ව්‍යාපාරය කිසිසේ ම එසේ වූයේ නැත. රාජ්‍ය පාර්ශ්වයේ අපේක්ෂකයින් රාජ්‍ය දේපල අයුතු ලෙස ප්‍රයෝජනයට ගැනීම දක්නට හැකි වූ අතර සැලකිය යුතු ප්‍රචණ්ඩත්වයක් පැවතිය ද පොලිසිය ඒ සම්බන්ධයෙන් ඇල් මැරුණු ක්‍රියාමාර්ගයක් අනුගමනය කරනු දකිය හැකි විය. මැතිවරණ කොමසාරිස් ද ඉතා උදාසීන ස්වභාවයක් පෙන්නුම් කළේය. මේ තත්වයෙන් ගොඩ ඒම ට ඇති එකම විසඳුම වන්නේ 17 වන සංශෝධනය යටතේ ස්වාධීන රාජ්‍ය සේවා කොමිසමක්, පොලිස් කොමිසමක් හා මැතිවරණ කොමිසමක් ස්ථාපනය කිරීම පමණි.

දකුණු හා ඌව පළාත් වෙනුවෙන් මේ වසරේ අවසාන භාගයේ දී මැතිවරණ පැවත්වීමට රජය සූදානමින් සිටියි. එසේම මහ මැතිවරණය හා ජනාධිපතිවරණය 2010 වර්ෂයේ පැවැත්වීමට ඉඩ කඩ තිබේ. සිය අභිමතය පරිදි ව්‍යවස්ථා සංශෝධනයක් සිදු කිරීම උදෙසා තුනෙන් දෙකක බහුතර බලයක් ලබා ගැනීම රජයේ අපේක්ෂාවයි. ප්‍රාදේශීය මැතිවරණවල දී කලින් පැවති ඡන්ද ක්‍රමය හා සමානුපාතික නියෝජනය යන දෙකම එකවර යොදා ගැනීම සම්බන්ධයෙන් කුඩා පක්ෂවල විරෝධය මතුව තිබේ. රජය සැලසුම් වන්නේ ප්‍රාදේශීය මැතිවරණවලින් ආරම්භ කර මෙය මහ මැතිවරණය කරා ගෙන යෑමයි.

ආරක්ෂාව සම්බන්ධයෙන් සලකා බලන විට එල්ටීටීඊ සංවිධානය යුද මුත්ත කලාපයේ වර්ග කිලෝමීටර් සුලු ගණනක බිම් ප්‍රමාණයකට සීමා කිරීමට රජයේ ආරක්ෂක අංශ සමත් වී තිබේ. එල්ටීටීඊයේ පස් බැමි බිඳ දමා මේ ප්‍රදේශයේ සිරවී සිටි සිවිල් වැසියන් 100,000 අධික ප්‍රමාණයකට රජයේ පාලන ප්‍රදේශ කරා පැමිණීමට ද ඔවුන් විසින් ඉඩකඩ සලසා තිබේ. තවත් සිවිල් වැසියන් 20,000 - 50,000 අධික සංඛ්‍යාවක් මේ ප්‍රදේශවල සිරවී සිටින බවට විශ්වාස කෙරේ. ගැටුම්වලට මැදිව සිවිල් වැසියන් තුවාල ලැබීම අවධාරණය කළ යුතු කරුණක් බවට පත් ව තිබේ. වව්නියාවට ගොස් අභ්‍යන්තර අවතැන්වූවන්ගේ තත්ත්වය සොයා බැලීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ජ්‍යෙෂ්ඨ නියෝජිතයින් කිහිප දෙනෙක් මෙන් ම බටහිර රටවල නියෝජිතයින් ද පැමිණ තිබේ. එක්සත් ජාතීන්ගේ සංවිධානයට හා අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධානවලට හා සෙසු රාජ්‍ය නොවන සංවිධානවලට අභ්‍යන්තර අවතැන්වූවන් කරා ළඟා වීමේ ඉඩ කඩ රජය විසින් පුළුල් කර තිබේ. එසේම කඳවුරු පාලනයේ දී, එය හමුදාවට ම පමණක් නොපවරා සිවිල් වැසියන්ට ද පාලනයේ කිසියම් අවස්ථාවක් ලබා දිමට කටයුතු කර තිබේ.

සිවිල් වැසියන්ට හානි සිදු වීම වැළැක්වීම සඳහා සිය මෙහෙයුම්වලදී තව දුරටත් බර අවි භාවිතය සිදු නොකරන බවට රජය විසින් ප්‍රකාශයක් නිකුත් කර ඇත. කෙසේ වෙතත් මුදා ගැනීමේ මෙහෙයුම් සේ හැඳින්වෙන සටන් නැවත්වීමට රජය එකඟ වී නොමැත.

ජනාධිපති මහින්ද රාජපක්ෂ, එල්ටීටීයේ අගනුවර සේ පැවති කිලිනොච්චි ප්‍රදේශයේ සංචාරයක නිරත විය. මෙය කිසියම් පණිවිඩයක් ගෙනන වැදගත් සිදු වීමක් සේ සැලකිය හැකිය.

අප්‍රේල් මසයේ දී රට මුහුණ පා සිටින දුෂ්කර ආර්ථික තත්ත්වය හමුවේ රජය අපහසුවෙන් යුතුව සිය කටයුතු කරගෙන යන ආකාරය දක්නට ලැබුණි. දැනට අප සතුව ඇති විදේශ සංචිත ප්‍රමාණවත් වන්නේ සති කිහිපයක ආනයනයන්ට පමණි. අන්තර්ජාතික මූල්‍ය අරමුදල මගින් ශ්‍රී ලංකාවට ලබා දෙන ඇමරිකානු ඩොලර් මිලියන 1.9 ණය සම්බන්ධයෙන් සියලු පූර්ව කටයුතු නිමා වී තිබේ. රජය විසින් මානව හිමිකම් උල්ලංඝනය කරමින් සිටින බවට පළ වන ප්‍රකාශ නිසා මෙය ලබා දීම පිළිබඳ ගැටලු මතු වී ඇත. රජය ලිබියාවෙන් ඇමරිකානු ඩොලර් මිලියන 500 ණයක් අපේක්ෂාවෙන් සිටියි.

ශ්‍රී ලංකා ඉන්ධන සංස්ථාව සමග ඇමරිකානු ඩොලර් මිලියන 810 හෙජින් ගිවිසුමට අත්සන් කරන ලද විදේශීය බැංකු දෙකක් මේ මුදල නැවත අය කර ගැනීම සඳහා නීතිය හමුවට යාමට සූදානමින් සිටියි. රජය විසින් ජාතිය ගොඩනැගීමේ බද්ද 1 සිට 3 දක්වා වැඩි කර ඇති අතර ව්‍යාපාරයන්ට ආපසු අයවිය යුතු වැට් බදු මුදල් ගෙවීම පමා වීම ද සිදුව ඇත.

දැන් උද්ධමනය පාලනය කරන ලද තත්ත්වයක පවතියි. අප්‍රේල් මාසයේ මේ අගය 2.9 විය. ගෝලීය ආර්ථික අර්බුදය හමුවේ බලපෑමට ලක්ව සිටින ව්‍යාපාරවලට උපකාරයක් සේ මහ බැංකුව විසින් නීති රීති ලිහිල් කර තිබේ. කොටස් මිල ඉහල නැග තිබූ අතර යුද්ධය නිමාවට පැමිණෙමින් තිබීම මෙයට හේතු විය හැකිය. කෙසේ වෙතත් අපනයන සමාගම්වල සේවකයින් අඩු කිරීම හා වැඩ කරන පැය ගණන කපා හැරීම දිගට ම සිදු විය.

තද සුළං තත්ත්වයන් හා සුළු ගංවතුර නිසා දිවයිනේ ප්‍රදේශ කිහිපයක ම දේපළ හානි සිදු විය. නැගෙනහිර පළාතේ හා සීගිරිය ප්‍රදේශයේ සුලු භූ කම්පන වාර්තා වූ අතර මේ නිසා නව ගොඩනැගීම්වලදී භූ කම්පන අවදාම පිළිබඳ අවධාරණය කළ යුතු වනු ඇත.
කොලඹ ප්‍රදේශයේ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම අර්බුදයකට මුහුණ පෑවේ, අපද්‍රව්‍ය බැහැර කිරීමට වෙන්වූ නව භූමිභාගයේ අපද්‍රව්‍ය බැහැර කිරීමට ප්‍රදේශවාසින් ඉඩ ලබා නොදීම නිසාය. වව්නියාවේ කඳවුරු තැනීම සඳහා කැලෑ එළි පෙහෙළි කිරීම පාරිසරික වශයෙන් දීර්ඝ කාලීන අයහපත් ප්‍රතිඵල ඇති කිරීමට හේතුවනු ඇත. පරිසරය සම්බන්ධයෙන් ධනාත්මක ප්‍රවණතාවක් ද දක්නට ලැබිණි. එනම් බස්නාහිර පළාත් සභා මැතිවරණයේ දී භාවිත කරන ලද පෝස්ටර් හා

| | | | | | |
|---|---|---|---|---|---|
| වෙනසක් නැත | → | මඳ ප්‍රගතියක් පෙන්වයි | ↗ | මඳ පිරිහීමක් පෙන්වයි | ↘ |
| සැලකිය යුතු ප්‍රගතියක් පෙන්වයි | ↑ | සැලකිය යුතු පිරිහීමක් පෙන්වයි | ↓ | | |

# ජාතික විශ්ලේෂණය 2009 මාර්තු 28 - 2009 අප්‍රේල් 28

## දේශපාලන සංදර්භය

සන්ධානය නමින් ප්‍රකට එක්සත් ජනතා නිදහස් සන්ධානය දිගින් දිගට ම ලබන්නට වූ දේශපාලන ජයග්‍රහණ නිසා පාර්ලිමේන්තුව තුළ කටයුතු කරන ලියාපදිංචි දේශපාලන පක්ෂ අතර එහි ජනප්‍රියත්වය ඉහළ යමින් පවතියි. මෙය රජයේ දේශපාලන තත්වය උසස් කිරීමට හේතු වී තිබේ.

බස්නාහිර පළාත් සභා මැතිවරණය අවසන් වී ඇති අතර දැනට ඉතිරිව ඇති ඌව හා දකුණු පළාත් සභා අගෝස්තු මාසයේ දී විසුරුවා හැර සැප්තැම්බර් අග භාගයේ දී හෝ ඔක්තෝබර් මුල් භාගයේ දී මැතිවරණය පැවැත්වීමට නියමිතය. වසර ගණනාවකට පසු උතුරු පළාතේ ද මැතිවරණයක් පැවැත්වෙනු ඇති අතර මෙය සමහර විට 2010 වර්ෂයේ අග භාගයේ දී පමණ පැවැත්වෙනු ඇත.
පළාත් සභා නමයෙන් හයක බලය හිමි කරගෙන රජය බලවත් හා ස්ථාවර තත්ත්වයක සිටින අතර එල්ටීටීඊය දැනට ලබා සිටින බලවත් පසුබෑම මහ මැතිවරණ හා ජනාධිපතිවරන ජයග්‍රහණයක් කරා රජය ගෙන යාමට පොලඹවනු ඇත. මේ මැතිවරණයන් දෙක ම 2009 නොවැම්බර් 19 වැනි දිනට පසු හා 2010 අප්‍රේල් 13 වැනි දිනට පෙර පැවැත්වීමට නියමිතය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරණයක් පැවැත්විය හැක්කේ වසර හතරකට වරක් පමණි. (පෙර වතාවේ දී එය 2005 වර්ෂයේ දී පැවැත්විණි.)

ජනාධිපතිතුමාට ජනමත විචාරණයක් පැවැත්වීමේ හැකියාව ඇතත් එවැන්නක් කිරීමට ඔහු පැකිලෙන්නේ ආසන 225 ප්‍රමාණයෙන් බහුතරයක බලයක් ලබා ගෙන ව්‍යවස්ථා සංශෝධනයක් සඳහා යෑමේ අපේක්ෂා සහිතව විය හැකිය. මෙහිදී අග්‍රාමාත්‍යවරයා ප්‍රමුඛ පාර්ලිමේන්තුව විධායක බලයක් හිමිවන ව්‍යවස්ථා සංශෝධනයක් කෙරෙහි අවධානය යොමු වනු ඇත.

කලින් පැවති ඡන්ද ක්‍රමය මෙන් ම සමානුපාතික නියෝජන ක්‍රමය ද පවත්වා ගනිමින් නව මැතිවරණ නීති රීති හඳුන්වාදීම සාකච්ඡාවට භාජනය වී තිබේ. කෙසේ වෙතත් මෙසේ මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම කුඩා දේශපාලන පක්ෂ අතින් බලන විට යහපත් නොවේ.

මෙය නැගෙනහිර පළාතේ සංවාදයට බඳුන් වූ අවස්ථාවේ දී ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසය ඒ සම්බන්ධයෙන් කැලඹීමක් ඇති කර ඇත. මෙම ක්‍රමය මහ මැතිවරණයක දී හඳුන්වා දීමට පෙර පළාත් සභා හා ප්‍රාදේශීය සභා මැතිවරණයක දී හඳුන්වා දීමට රජය අපේක්ෂා කළත් මේ දක්වා එය සිදු වී නොමැත.

මේ මැතිවරණ සියල්ලේ දී ම පීඩනය එල්ල වන්නේ මහා භාණ්ඩාගාරයට ය. දැනටමත් උතුරේ 250, 000 පමණ අභ්‍යන්තර අවතැන් වූ පිරිස ගේ අර්බුදයට මුහුණ පා සිටින මහා භාණ්ඩගාරයට මෙය දැරිය නොහැකි බරක් වනු ඇත.

## පාලනය

**තවත් දූෂිත මැතිවරණයක්..**

බස්නාහිර පළාත් සභා මැතිවරණය 2009 අප්‍රේල් මස 25 වැනි දා පැවැත්විණි. මැතිවරණ දිනයේ බැරෑරුම් මැතිවරණ දූෂණ ක්‍රියා වාර්තා නොවූ අතර මුළු පළාත පුරා ම සාමකාමී ස්වරූපයකින් මැතිවරණ කටයුතු පැවැත්විණි. පූර්ව මැතිවරණ සමයේ දේශපාලන පක්ෂ හා අපේක්ෂකයන් අතර ඇති වූ ගැටුම් මැතිවරණ දිනයේ වාර්තා නොවිණි.

විශේෂයෙන් ම මැතිවරණ සමයේ දී පොලිසියේ කාර්යභාරය ඉතා වැදගත් වේ. නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීම සඳහා ඔවුන් විසින් කිසියම් පාර්ශ්වයකට ගැති නොවී ඉටු කළ යුතු කටයුතු බොහොමයකි. මැතිවරණ සමයේ දී සමහර නීති විරෝධී ක්‍රියා මැඩ පැවත්වීමට පොලිසිය විසින් උත්සහ දරූ ආකාරය පෙණුනි. කෙසේ වෙතත් මෙය ප්‍රමාණවත් නොවූ අතර විශේෂයෙන් ම චූදිතයන් රාජ්‍ය හිතවාදීන්වන අවස්ථාවල දී නීතිය ක්‍රියාත්මක වන ආකාරයක් නොපෙනුණි. මැතිවරණ නීති රීති උල්ලංඝනය වන අවස්ථාවන්වල දී පොලිසිය විසින් වඩාත් කාර්යක්ෂම ලෙස මැතිවරණ කොමසාරිස් කාර්යාලය සහ සෙසු දේශපාලන පක්ෂ හා එක්ව කටයුතු කළ යුතුව තිබුණි. මෙය මෙසේ ක්‍රියාත්මක නොවේ නම් නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීමේ ඉඩ කඩ අහිමි වනවා මෙන් ම මැතිවරණ ක්‍රමය කෙරෙහි වන ජනතා විශ්වාසයද පළුදු වනු ඇත.

අවාසනාවකට මෙන් මහජන අකමැත්ත හා සිවිල් සංවිධාන මගින් මැතිවරණ නිරීක්ෂණ කටයුතු සිදු කිරීම මේ ප්‍රජාතන්ත්‍ර විරෝධී හා නීත්‍යානුකූල නොවන ප්‍රවාහය තුළ ඇති කර ඇත්තේ සුළු බලපෑමකි. නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීම උදෙසා සිය දෙපාර්තමේන්තුව වඩාත් ශක්තිමත් කළ යුතු බවට මැතිවරණ කොමසාරිස්තුමා අවධාරණය කර ඇත. දැනට පවතින තත්වය වෙනස් කිරීමට නම් නීතිය ක්‍රියාත්මක කරන ආයතන ස්වාධීනව හා පක්ෂග්‍රාහී නොවී කටයුතු කිරීම වැදගත් ය. ස්වාධීන පොලිසියක් මැතිවරණ හා රාජ්‍ය සේවා කොමිසන් සභා ආදිය ට මග පාදන 17වන සංශෝධන ස්ථාපනය කිරීම කෙරෙහි සිවිල් කණ්ඩායම් හා දේශපාලන පක්ෂ උනන්දුවිය යුත්තේ මේ හෙයිනි. රටක ප්‍රජාතන්ත්‍රවාදය හා යහපාලනය තහවුරු කිරීමට නම් සිය අරමුණු සඳහා කැපවී සිටින ස්වාධීන ආයතන අත්‍යවශ්‍ය වේ.

## ආරක්ෂක තත්ත්වය

එල්ටීටීඊ සාමාජිකයන් වෙල්ලායිමුල්ලිවයික්කාල් හා වේලායන්මඩම් අතර වර්ග කිලෝ මීටර් 10ක බිම් කොටසකට සීමා කිරීමට ආරක්ෂක හමුදා සමත් ව සිටිති. එල්ටීටීඊ නායකයින්ට පැය 24 ඇතුළත යටත්වන සේ ඉල්ලීම් කර ඇතත් මෙයට කිසිම ප්‍රතිචාරයක් ලැබී නොමැත.

ආරක්ෂක හමුදා විසින් ආරක්ෂක කලාපයේ බටහිර කොටසේ පුදුමාතලන් ප්‍රදේශයේ දී කිලෝ මීටර් තුනක් දිග එල්ටීටීඊ පස් බැම්ම බිඳ දැමීමෙන් පසු 100,000 පමණ වූ සිවිල් වැසියන් ප්‍රමාණයකට රජයේ පාලන ප්‍රදේශවලට පැමිණීමේ ඉඩකඩ සැලසුණි. එල්ටීටීඊය සමග ඇති වූ දරුණු ගැටුම්වලින් පසුව මේ ප්‍රදේශය කරා ළඟා වීමට ආරක්ෂක හමුදාවලට හැකි විය. නියමු රහිත යානා මගින් හා බුද්ධි අංශ තොරතුරුවලින් ලද වාර්තාවලට අනුව 58වන බලකායේ ප්‍රධාන අණදෙන නිලධාරී විසින් මේ බේරා ගැනීමේ මෙහෙයුම සඳහා සැලසුම් සකස් කරන ලදි. සොල්දාදුවන් 8-10 දක්වා සංඛ්‍යාවක් ඇතුළත්වන කණ්ඩායම්වලට වෙන් කර ඒ ඒ කණ්ඩායම් වෙත විශේෂ වගකීම් පැවරීම සිදු විය. 9 වැනි ගැමුණු හේවා බලකාය, 8 වැනි ගජබා රෙජිමේන්තුව, 11 වැනි පාබල සේනාංකය, 2 වැනි කමාන්ඩෝ රෙජිමේන්තුව හා 1 වැනි විශේෂ කාර්ය බලකාය මේ මෙහෙයුමට සහභාගී විය. මෙහි ප්‍රධාන අරමුණ වූයේ පුදුමාතලන් සිට අම්පලාවන්පොක්කනෛ දක්වා වූ එල්ටීටීඊයේ පස් බැම්ම බිඳ දැමීමයි. 2 වැනි කමාන්ඩෝ රෙජිමේන්තුව හා 8 වැනි ගජබා රෙජිමේන්තුව පස්බැම්මේ උතුරු කෙළවර සිටි අතර 1 වැනි විශේෂ කාර්ය බලකාය විසින් 11 වැනි පාබල සේනාංකය පස් බැම්මේ දකුණු කෙළවරට ගෙන ගොස් තිබුණි. මේ අතර 9 වැනි ගැමුණු සේනාංකය ඉදිරියට යන හමුදා වෙනුවෙන් මග සැදීමේ හා රජයේ ප්‍රදේශවලට එන සිවිල් වැසියන්ට මග පෙන්වීම සිදු කළේය. මේ අනුව දින තුනක දරුණු ගැටුම්වලින් පසු පුදුකුඩුඉරිප්පු ප්‍රදේශයේ බලය සම්පූර්ණයෙන් ම තහවුරු කර ගැනීමට රජයේ හමුදාවලට හැකියාව ලැබුණි. මෙහිදී එල්ටීටීඊ සංවිධානයට බරපතල හානි සිදු වී තිබේ. මේ ගැටුම්වල දී මිය ගිය අය අතර එල්ටීටීඊ ජ්‍යෙෂ්ඨ නායකයින්වන තීපන් (උතුරේ ප්‍රාදේශීය නායක), රූබන්, නාගේෂ්, ගඩාෆි ( එල්ටීටීඊ නායකයාගේ හිටපු ආරක්ෂකයින්), විදූෂා (මාලතී කාන්තා බලකායේ නායිකා), දුර්ගා (සෝතියා කාන්තා බලකායේ නායිකා), කමලිනි (කාන්තා දේශපාලන අංශ නායිකා) හා මන්නිවන්නෛ (බර අවි අංශයේ නායක) වෙති. බුද්ධි අංශ වාර්තා කරන අන්දමට යුද මුක්ත කලාපයේ එල්ටීටීයට අයත් තවත් සැහැල්ලු ගුවන්යානයක් සඟවා තිබේ.

මේ ගැටුම්වලදී මියගිය එල්ටීටීඊ සාමාජිකයන් සංඛ්‍යාව රජය විසින් හෙළිදරව් කළත් මිය යන ආරක්ෂක අංශ සාමාජියකයන් ගේ සංඛ්‍යාව හෙළිදරව් කිරීමට ඔවුන් පැකිළෙන බවක් පෙනේ. නිල නොවන වාර්තාවලට අනුව මාර්තු 3 වැනි දා වන විට තුවාල ලත් සොල්දාදුවන් 540 දෙනෙකු කොළඹට ගෙනැවිත් තිබුණි.

අම්පාර ප්‍රදේශයේ ඇති වූ වෙඩි තැබීමක දී විශේෂ කාර්ය බලකාය විසින් කොටි සාමාජිකයින් 13 දෙනෙක් විනාශ කර තිබේ. මෑතක දී මොණරාගල හා බුත්තල ප්‍රදේශවල මෙන් ම නැගෙනහිර සෙසු ප්‍රදේශ කිහිපයක සිදු වූ සිවිල් වැසියන්ට පහර දීම්වලට මේ කණ්ඩායම වග කිවයුතු බව විශේෂ කාර්ය බලකාය විශ්වාස කරයි.

මානුෂීය සටන් විරාමයක් වෙනුවෙන් එක්සත් ජාතීන්, එක්සත් ජනපදය හා එක්සත් රාජ්‍යය විසින් කරන ලද ඉල්ලීම් ප්‍රතික්ෂේප කළ රජය, 27 වැනි සඳුදා එක්වරම බර අවි භාවිතය හා ගුවන් ප්‍රහාර එල්ල කිරීම නවතා ඇති බවට ප්‍රකාශයක් නිකුත් කළේය.මෙය සිදුවූයේ BBC සමග කළ සාකච්ඡාවක දී ත් රජයේ හමුදා බර

අවි භාවිතය අත් හැර ඇති බව ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ කර ඇති ප්‍රකාශයට අනතුරුවය..

මේ කාලය තුළ සිදු වූ තවත් සුවිශේෂ සිදුවීමක් ලෙස අළුත් අවුරුදු සමයේ ජනාධිපතිතුමා කිලිනොච්චි ප්‍රදේශයට සිදුකළ සංචාරය දැක්විය හැකිය. මේ සංචාරයේ දී ඔහු වීදි වල නිදහසේ ඇවිදිමින් හමුදා භටයින්, සිවිල් වැසියන් හා අභ්‍යන්තර අවතැන් වූවන් සමග කතාබස් කළේය.

## මානව හිමිකම්

### මාර්තු 21 සිට අප්‍රේල් 20 දක්වා මානව හිමිකම් විශ්ලේෂණය

පහත දක්වෙන ප්‍රස්ථාර විවිධ මුද්‍රිත හා ඉලෙක්ට්‍රොනික මාධ්‍ය වලින් වාර්තා පදනම් කරගෙන ඇත. (දි අයිලන්ඩ්, ඩේලි මිරර්, ඩේලි නිවුස්, වීරකේසරි, තිනකුරල්, සුඩර්ඔලි, ලංකා පේජ් හා CHA දිස්ත්‍රික් කාර්යාලය)

**අත්අඩංගුවට ගැනීම් (160)**

| | |
|---|---|
| අම්පාර | 49 |
| කොළඹ | 36 |
| පුත්තලම | 26 |
| හම්බන්තොට | 14 |
| මාකර | 08 |
| මන්නාරම | 05 |
| ගම්පහ | 04 |
| වව්නියාව | 04 |
| අනුරාධපුර | 04 |
| මහනුවර | 03 |
| මාතලේ | 03 |
| ත්‍රිකුණාමලය | 02 |
| ගාල්ල | 01 |
| නුවරඑලිය | 01 |

**පැහැරගෙනයාම් (14)**

| | |
|---|---|
| අම්පාර | 03 |
| මන්නාරම | 03 |
| කොළඹ | 03 |
| මඩකලපුව | 02 |
| යාපනය | 01 |
| වව්නියාව | 01 |
| පුත්තලම | 01 |

**තුවාල සිදුකිරීම් (953)**

| | |
|---|---|
| මුලතිව් | 934 |
| කලුතර | 04 |
| මඩකලපුව | 04 |
| පොළොන්නරුව | 04 |
| යාපනය | 03 |
| ත්‍රිකුණාමලය | 02 |
| කොළඹ | 01 |
| ගම්පහ | 01 |

**අතුරුදන්වීම් (9)**

| | |
|---|---|
| මන්නාරම | 04 |
| අම්පාර | 02 |
| යාපනය | 01 |
| මඩකලපුව | 01 |
| ගාල්ල | 01 |

**ඝාතන/මරණ (198)**

| | |
|---|---|
| මුලතිව් | 138 |
| මොණරාගල | 12 |
| ත්‍රිකුණාමලය | 07 |
| කලුතර | 06 |
| අම්පාර | 06 |
| පොළොන්නරුව | 05 |
| වව්නියාව | 04 |
| ගාල්ල | 04 |
| මඩකලපුව | 04 |
| කුරුණෑගල | 03 |
| කොළඹ | 02 |
| ගම්පහ | 02 |
| මන්නාරම | 02 |
| මහනුවර | 01 |
| පුත්තලම | 01 |
| නුවරඑලිය | 01 |

**ඝාතන**

| | |
|---|---|
| බෝම්බ පිපිරීම් නිසා | 137 |
| වෙඩි තැබීම් | 50 |
| මළ සිරුරු හමුවීම | 11 |

## ආර්ථික සන්දර්භය

පවතින මූල්‍ය තත්ත්වය අවුල් කර දමන සුලු වූ සංඥා හා සලකුණු අප්‍රේල් මාසයේ දී දක්නට විය. අන්තර්ජාතික මූල්‍ය අරමුදලින් රජය ලබා ගැනීමට නියමිත ඩොලර් මිලියන 1.9ක ණය මුදල ආදී, රජය අනුගමනය කරන ක්‍රියා මාර්ග අසාර්ථක වුවහොත් මෙම අර්බුදකාරී තත්ත්වය තවදුරටත් වර්ධනය විය හැකිය.

මාසයේ අග භාගය වන විට මේ ණය මුදල පිළිබඳ සියලු පූර්ව කටයුතු අවසාන කර තිබුණි. උතුරේ තත්වය නිසා මේ ණය මුදල ලබා නොදීමට හෝ පමා කිරීමට විවිධ පීඩන එල්ල කෙරෙමින් තිබේ. රජය ලිබියාවෙන් ඩොලර් මිලියන 500 ණය මුදලක් ලබා ගැනීමට සාකච්ඡා කරමින් සිටියි.

2009 අයවැයේ දී හඳුන්වා දෙන ලද ජාතිය ගොඩනැගීමේ බද්ද 1% සිට 3% දක්වා වැඩි කර තිබේ. රජය වරින් වර බදු වල කලින් සැලසුම් නොකරන ලද සංශෝධනයන් සිදු කරමින් සිටියි. මිය ඉහල යෑම පිළිබඳ ජනතා චෝදනාවලින් මිදීමට රජය විසින් බදු අඩුකරමින් සිටියත් රාජ්‍ය ආදායම් ලබා ගැනීමේ මාර්ගක් සේ කිසියම් ක්‍රමයකින් බදු වැඩි කිරීම ද සිදු කරයි. රජය විසින් ව්‍යාපාරයන්ට ගෙවිය යුතුව ඇති වැට් මුදල් ගෙවීම පමා කිරීම සම්බන්ධයෙන් රජයට චෝදනා එල්ල වෙයි.

හෙජින් ගිවිසුමට සම්බන්ධ වූ විදේශ බැංකු පහක් හා රජය අතර සාකච්ඡා බිඳ වැටී ඇත්තේ මේ බැංකු පහෙන් දෙකක් වන සිටි බැංකුව හා ඩොයිෂ් බැංකුව රජයට එරෙහිව ආයෝජන මතභේද නිරාකරණය කිරීමේ අන්තර්ජාතික මධ්‍යස්ථානය හමුවට යෑමට සූදානමින් සිටින බැවිනි. ගිවිසුමට අනුව රජය විසින් බැංකුවලට ඩොලර් මිලියන 810 ගෙවිය යුතු වේ. මෙය පසුගිය මාසය අග දී පැවති මුළු විදේශ සංචිත ප්‍රමාණයෙන් අඩක් පමණ වේ. මෙසේ විශාල මුදලක් ගෙවීමට සිදු වීම නිසා ආර්ථික තත්ත්වය තව තවත් දූර්වල වනු ඇත.

උද්ධමනය පිට පිට ම දසවන වතාවටත් පහළ ගොස් තිබේ. අප්‍රේල් මාසයේ එය 2.9% සේ පැවතිණි. කෙසේ වෙතත් රුපියල අවප්‍රමාණවීම නිසා එළඹෙන මාස වල මෙය ඉහළ යනු ඇත.

පහළ මට්ටමක පවතින උද්ධමනය නිසා බැංකු ණය ලබා දීම දිරි ගැන්වීමට මහ බැංකුව කටයුතු කරමින් සිටියි. අප්‍රේල් මාසයේ දී බැංකුව මිලදී ගැනීමේ අනුපාතිකය 10.25% සිට 9% දක්වා පහත හෙළන ලදි. එසේ ම 14.75%ක් ව පැවති දණ්ඩන අනුපාතිකයන් ද 13% කර තිබේ. රාජ්‍ය බැංකු විසින් ණය දෙන ප්‍රමුඛතා ක්ෂේත්‍රවලය ණය දෙන අනුපාතිකය 2% හෝ 3% ක ප්‍රතිශතයකින් ඉහළ නංවා තිබේ. කෙසේ වෙතත් වාණිජ බැංකුවල ප්‍රාථමික අනුපාතිකයින් සාමාන්‍යය 19%කට ඉහළ අනුපාතයක් ව පැවතිණි.

ගෝලීය අර්ථික අර්බුදය හමුවේ පීඩාවට පත් පෞද්ගලික ණය ලබා ගන්නන්ට සහයෝගය දැක්වීමක් සේ බැංකු ණයක් බලාත්මක නොවන සේ හැඟවෙන කාල සීමාව දික් කිරීමට මහ බැංකුව විසින් උපදෙස් ලබා දී තිබේ. දැනට එය මාස තුනක් සේ පවතින අතර මාස 6 දක්වා දික් කිරීමට උපදෙස් ලබා දී තිබේ.

දිවයනේ විදුලි බල පහසුකම් ලබා දීම සඳහා ආසියනු සංවර්ධන බැංකුවෙන් ඩොලර් මිලියන 160 වන ණය මුදල් දෙකක් ලබා දී ඇත. ශ්‍රී ලංකාවේ නිවාස 20% විදුලි පහසුකම් නොමැති බවට ගණන් බලා තිබේ.

කලක් තිස්සේ සේවකයන් හා සේව්‍යයන් අතර නිල නොවන ගිවිසුමක් සේ පැවති සේවයකයන් අඩු කිරීම හා පැය ගණන අඩු කිරීම දිගින් දිගට ම සිදු වේ. මේ සේවක හා සේව්‍ය කැමත්ත අනුව සිදු කිරීමට අවසර දීමට රජය එකඟ වී තිබේ.

වතු සේවකයින් හා පාලකයින් අතර ඇති වූ දෑවුරුදු ඒකාබද්ද වැටුප් ගිවිසුම අප්‍රේල් මාසයේ අවසන් විය. වතු සේවකයින්ට රුපියල් 500 දිනක වැටුපක් ඉල්ලා ඉල්ලීම් කිරීමට ජනතා විමුක්ති පෙරමුණ සූදානමින් සිටියි.

කොටස් මිල මගින් පමණක් මුළු ආර්ථිකයම විශ්ලේෂණය කළ නොහැක. කෙසේ වෙතත් එහි වෙනස්වීම් කොටස් වෙළඳ පළ ආයෝජකයන් තුළ අපේක්ෂා ඇති කිරීමට හේතු වේ. යුද්ධය නිමා වීම නිසා නව ව්‍යාපාර අවස්ථා ඇති වීමේ බලාපොරොත්තුව නිසා කොටස් මිල දර්ශකය 10%කින් ඉහළ ගොස් තිබේ.

# පරිසරය

**අ**ප්‍රේල් මාසය තුළ විවිධ ස්වාභාවික ව්‍යසයන ඇතිවනු දක්නට ලැබුණි. මාසයේ මුල භාගයේ දී සුළි සුළං තත්ත්වයන් වර්ධනය වීමක් සිදු විය. අප්‍රේල් 4 වැනි දා වයඹ ප්‍රදේශයේ හලාවත දීද නිරිත ප්‍රදේශයේ හොරණ දී ද ඇති වූ සුළි සුළං නිසා නිවාස 130කට අලාභ හානි සිදු වී තිබේ. අප්‍රේල් 06 වැනිදා නුවර එළිය දිස්ත්‍රික්කයේ ඇති වූ සුළි සුළං නිසා නිවාස 35කට අලාභ හානි සිදු වී නිවාස 4 සම්පූර්ණයෙන් ම විනාශ වී ඇත. මේ නිසා 100ක් පමණ අවතැන්ව සිටිති. අප්‍රේල් 08 වැනි දා පුත්තලමේ කරුවලගස්වැව ප්‍රදේශයේ ඇති වූ සුළං තත්ත්වය නිසා නිවාස 50 කට පමණ අලාභ හානි සිදු වී තිබේ. අධික වැසි නිසා මාසයේ මුල් භාගයේ දී සුළු ගංවතුර තත්ත්වයන් ඇති විය. වන්නි ප්‍රදේශයේ ඇති වූ සුළු ගංවතුර තත්ත්වය නිසා අභ්‍යන්තර අවතැන් වූවන්ට ද බලපෑම් ඇති විය.

දිවයිනට සුළු භූ කම්පන තත්ත්වයන් දෙකක් අත්දැකීමට සිදු වූ අතර පළමු වැන්න අප්‍රේල් මස 15 වැනිදා සිදු වූ අතර මෙය අම්පාර, මඩකලපුව, හම්බන්තොට, බදුල්ල හා මොණරාගල යන ප්‍රදේශවලින් වාර්තා වී තිබේ. දෙවැන්න අප්‍රේල් 21 වැනිදා ඇති වූ අතර මෙහි බලපෑම වූයේ සීගිරිය ප්‍රදේශයට ය. විශේෂඥයින් දක්වන අන්දමට මෙය ශ්‍රී ලංකාවට කිලෝමීටර් 500 දකුණින් නව භූ තැටියක් සෑදීමේ ප්‍රතිඵලයකි. මෙය 2004 සුනාමිය ඇති වීමට ද සෘජුව ම බලපා ඇත. තවත් කම්පන ඇති විය හැකි බවට අනතුරු ඇඟවෙන අතර නව ගොඩනැගිලි ව්‍යාපෘතිවල දී මෙය සැලකිල්ලට ගැනීම වැදගත් ය.

අප්‍රේල් මාසයේ කොළඹ නගරයේ කසල අර්බුදයක් ඇති වූයේ කුණු කඳු ගණන් වීදිවල ගොඩ ගැසී තිබීම නිසාය. බ්ලූමැන්ඩල් ප්‍රදේශයේ තව දුරටත් කුණු බැහැර කිරීම තහනම් කරමින් ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයක් නිකුත් කිරීම මෙයට හේතු විය. කුණු බැහැර කිරීම සඳහා නව භූමියක් පැලියගොඩ ප්‍රදේශයේ නම් කර ඇතත් ඒ අවට ප්‍රදේශවාසීන්ගේ විරෝධය නිසා එතැන කුණු බැහැර කිරීම සිදු කිරීමට නොහැකි වී තිබේ. මේ නිසා කුණු වීදිවල ගොඩගැසීම සිදු වී තිබේ. මේ තත්වයන් යටතේ මදුරුවන් බෝ වීම සුලබව සිදු විය හැකි නිසා ඩෙංගු ආදී රෝගී තත්වයන් සම්බන්ධයෙන් අවධානයෙන් සිටින ලෙස සෞඛ්‍ය බලධාරීන් අනතුරු අඟවා තිබේ. අලුත් අවුරුදු සමයේ දී දිවයින පුරා පැල මිලියන දෙකක් සිටුවීමේ ආරම්භක පියවරක් ගෙන ඇති අතර මෙය අද පැලයක් සිටුවා හෙට ඵල ලබන්න යන තේමාව යටතේ සිදු කෙරේ. මෙය රජයේ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියේ අංගයකි.

අප්‍රේල් මස 25 වැනි දින පැවති බස්නාහිර පළාත් සභා මැතිවරණයේ දී ප්ලාස්ටික් බැනර් හා සැරසිලි භාවිතය මෙන් ම පෝස්ටර් ඇලවීම ද සැලකිය යුතු ප්‍රමාණයකට අඩු වී තිබේ.

වව්නියාව මැණික් ෆාම් ආදී ප්‍රදේශවල අභ්‍යන්තර අවතැන්වූවන් වෙනුවෙන් පහසුකම් සැපයීම සඳහා අවිචාරවත් ලෙස කැලෑ එළි කිරීම නිසා පරිසර ප්‍රශ්න ඇති වෙමින් පවතියි. මේ ප්‍රදේශවල ඇති විශාල ගස් කපා දැමීම නිසා නිවාස සඳහා සෙවණ අහිමි වීම හා ගංවතුර ඇති වීම වර්ධනය වීම සිදු වී තිබේ.

# සිවිල් සමාජය හා මාධ්‍ය අවකාශය

**යු**ද්ධය නිමාව දකිමින් සිටින මෙවැනි අවස්ථාවක 17 වැනි දා ඩේලි මිරර් පුවත්පතේ ආචාර්ය දයාන් ජයතිලක විසින් මේ පීඩිත දිවයිනේ ඉදිරිමග සම්බන්ධයෙන් දක්වන ලද අදහස් සලකා බැලීම වටී.

සාමාන්‍ය දිනුමකින් ඔබ්බට ගිය උපක්‍රමික ජයග්‍රහණයක් යන ශීර්ෂ පාඨය යටතේ නම් කරන ලද ඔහුගේ ලිපියේ සඳහන්වන අන්දමට දීර්ඝ කාලීන වශයෙන් පවතින සාමයක් පවත්වා ගැනීමට නම් 13 වැනි සංශෝධන කඩිනමින් සම්පූර්ණ වශයෙන් ස්ථාපනය කළ යුතු වේ. සිය ලිපියේ ඔහු දක්වන ආකාරයට 13වන සංශෝධන ස්ථාපනය කිරීම වැදගත් වන්නේ ඊට ම සම්බන්ධ හේතු ගණනාවක් නිසාය. අනන්‍යතාව, ස්වාධිපත්‍යය හා ප්‍රමාණවත් තරම් ඉඩකඩ මේ අතරින් කිහිපයක් සේ දැක්විය හැකිය. ඔහු තව දුරටත් දක්වන අන්දමට එම ප්‍රදේශවල ජනයාට ප්‍රමාණවත් තරම් ලෙස විමධ්‍ය ගත කරන ලද බලයක් ලබා දීම වැදගත් වේ. කිසිම කෙනෙක් තමාගේ භාෂාව කතා නොකරන අයෙකු විසින් පාලනය කරනු ලැබීමට කැමති නොවේ. මේ සම්බන්ධයෙන් බොහෝ අදහස් දක්වන ඔහු අවසානයට මේ සියල්ල කතුවරයාගේ පෞද්ගලික අදහස් වේ යනුවෙන් සඳහන් කරයි. . මෙය ඉංග්‍රීසි පුවත්පත්වල දක්නට වූ සිහිල් සුලං රැල්ලක් සේ හැඳින්විය හැකිය.

සිංගප්පූරුවේ දේශපාලන ප්‍රචන්ඩත්වය හා ත්‍රස්තවාදය පිළිබඳ අන්තර්ජාතික පර්යේෂණ ආයතනයේ අංශ ප්‍රධාන මහාචාර්ය රොහාන් ගුණරත්න අප්‍රේල් 16 වැනි දින ඩේලි මිරර් පුවත්පතේ ශ්‍රී ලංකාවේ අර්බුදය අවසන් කිරීම යන මාතෘකාව යටතේ මෙසේ දක්වයි. ප්‍රජාතන්ත්‍රවාදය, බලය විමධ්‍යගත කිරීම හා සංවර්ධනය, ගැටුම් නිරාකරණය කිරීමේ ප්‍රතිඵල ශක්තිමත් කරයි. මෙය මුලදී ගැටුම් මූලයන් ඉවත් කිරීමේ සෘණාත්මක උත්සායක් වුවද අත්‍යවශ්‍ය වන්නේ යහපත් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාමර්ග අනුගමනය කිරීමයි. මන්ද ඒවා යහපාලනයේ ඵලදායී මෙවලම් වන බැවිනි. යහ පාලනය මගින් ගැටුම්වල අයහපත් බලපෑම් අවම කර ගත හැකි වේ.

ශ්‍රී ලංකාව සිංහල හා හින්දු නව වසර සැමරූ සමයේ මාධ්‍ය අවකාශය සම්බන්ධයෙන් සලකා බැලීමේ දී කලින් දක්වූ කරුණු ඉංග්‍රීසි පුවත්පත්වල පළ වූ නමුත් ඒවා සිංහල පුවත්පත්වල පළ වූයේ නැත. ශ්‍රී ලංකා පුවත්පත් කලාවේ පුරෝගාමියෙකු සේ සැලකෙන එඩ්මන්ඩ් රණසිංහ මහතා ( සිළුමිණ හා දිනමිණ පුවත්පත් රජයට පවරා ගැනීමට පෙර ඒවායේ ප්‍රධාන කර්තෘ, පසුව දිවයින හා දි අයිලන්ඩ් පුවත්පත්වල කර්තෘ හා උපාලි පුවත්පත් සමාගමේ ප්‍රධාන කර්තෘ හා කර්තෘ මණ්ඩල අධ්‍යක්ෂ) අප්‍රේල් 6 වැනි දා හා අප්‍රේල් 7 වැනි දා මුකුළිත වූ අපේ මාධ්‍යය යන මාතෘකාවෙන් යුතුව ඉතාම කාලීන ලිපියක් ඉදිරිපත් කරයි. කිසියම් කණගාටුවක් සහිතව ඔහු සිය ලිපිය ආරම්භ කරයි. *මෙය වටහා ගැනීම දුෂ්කර විය හැකිය. කෙසේ වෙතත් එමගින් රටේ මාධ්‍යවල තත්ත්වය පැහැදිලි කරයි.* ලිපියේ මැද භාගයේ දී නැවත ඔහු වැදගත් කරුණක් අවධාරණය කරයි. දේශපාලකයින් හා මාධ්‍යවේදීන් අතර සම්බන්ධතාව බාධාවකින් තොරව පවතියි. දැනට කිසියම් සාමකාමීබවක් දක්නට වේ. කිසිම දෙයක් සිදු නොවන අතර කිසිම පාඩමක් ද ඉගෙන ගෙන නැත. කිසිම දෙයක් වෙනස් නොවේ. එඩ්මන්ඩ් රණසිංහ මහතා සුවිශේෂ පුද්ගලයෙකි. ඔහු ජ්‍යෙෂ්ඨ කර්තෘවරයකු වශයෙන් සේවය කළ පුවත්පත් ආයතනය රජයට පවරා ගැනීමේ දී රජයට සේවය කිරීමේ වරප්‍රසාදය හැර දමා පුවත්පත් කාර්යාලයෙන් ඉවත් වීමට ඔහු තීරණය කළේය. හේතු දෙකක් නිසා මේ තත්ත්වය කණගාටුදායක වේ. පළමුකොට මෙවන් අදහස් සිංහල මාධ්‍යවල පළ නොවීම අවාසනාවකි. දෙවැනිකොට සිංහල මාධ්‍යවේදීන් බොහොමයක් දෙනා මෙවන් අය යටතේ හැදී වැඩී සිටීමයි.

පසුගිය මාසයේ ක්‍රියාත්මක වූ සිවිල් සංවිධානවල ප්‍රධාන කාර්යභාරය වූයේ බස්නාහිර පළාත් මැතිවරණය නිරීක්ෂණය කිරීමයි. මැතිවරණ සමයට පෙර පැවති ප්‍රචණ්ඩත්වය කසේ වෙතත් මැතිවරණය නිදහස් හා සාධාරණ සේ පැවැත්වූ බව මේ සංවිධාන වාර්තා කළේය.

ගෝලීය ආර්ථික අර්බුදය හමුවේ අන්තර්ජාතික මූල්‍ය අරමුදලට විශාල කාර්යභාරයක් පැවරී ඇත. මේ සඳහා සිවිල් සංවිධානවල සම්පත් උපයෝගී කර ගැනීමේ සැලැස්මක් පවතියි. මෙයට ආරම්භයක් වශයෙන් ඔවුන් සිවිල් සංවිධාන යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න සලකා බැලීම වැදගත් ය. අන්තර්ජාතික මූල්‍ය අරමුදල, විවිධ ස්ථරවලට අයත් පුරවැසියන් පිරිසක්, රටක වැසියන්ට ප්‍රතිලාභ, සේවා සළසන සංවිධානයක් හැඳින්වීමට මෙම යෙදුම භාවිත කරයි. ව්‍යාපාරික හමුවන්, විශ්වාසයන් පදනම් කර ගත් සංවිධාන, කම්කරු සමිති, ප්‍රාදේශීය ප්‍රජා කණ්ඩායම්, රාජ්‍ය නොවන සංවිධාන, ජනසරණ අරමුදල් ආදිය සිවිල් සංවිධාන සේ හඳුනාගෙන තිබේ. රජයට අයත් ආයතන, ස්වාධීන ව්‍යාපාර, දේශපාලන පක්ෂ හා ජනමාධ්‍ය සාමාන්‍යයෙන් මෙයට ඇතුළත් නොවේ. අපගේ සමාජය වැනි සියලුම කටයුතුවලට රජය බලපෑම් කරන සමාජයක සාමාන්‍යයෙන් ඇතුළත් නොවන සේ සැලකෙන රජයේ ආයතන සම්බන්ධ කර ගැනීම ගැන දෙවරක් සිතා බැලිය යුතු වේ.

# මානුෂීය හා සංවර්ධන අවකාශය

**ව**ව්නියාවේ කලින් හමුදා පාලනය යටතේ පැවති අභ්‍යන්තර අවතැන්වූවන්ගේ කඳවුරු යලි පදිංචි කිරීමේ අමාත්‍යංශය යටතට පවරා ගත් බව අප්‍රේල් මස මුල් භාගයේ දී රජය විසින් ප්‍රකාශ කරන ලදි. එසේම අභ්‍යන්තර අවතැන්වූවන් ජාතික හැඳුනුම්පත් සඳහා ලියාපදිංචි කිරීම ආරම්භ වී තිබේ. ජාතික හැඳුනුම්පත් ලබා දීමෙන් පසු ඔවුන්ට ගමනාගමන නිදහසක් ලබා දීම අපේක්ෂා කෙරේ. වියපත්වූවන්ට සිය නෑසියන් සමඟ රැඳී සිටීමට අවසර ලබා දී ඇත. අප්‍රේල් මස මුල් භාගයේ දී ශ්‍රී ලංකාවට පැමිණි අභ්‍යන්තර අවතැන්වූවන්ගේ මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ ලේකම්ගේ නියෝජිත මහාචාර්ය වෝල්ටර් කයිලින් සිය දින හතරක සංචාරය අවසානයේ වව්නියාවේ අභ්‍යන්තර අවතැන්වූවන්ගේ කඳවුරුවලට යාමෙන් හා රජයේ නියෝජිතයන් හමු වීමෙන් පසු පැවසුවේ යුද්ධය නිසා අවතැන් වී සිටින අයගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට පියවර ගන්නා ලෙසයි. රජය විසින් යුධ මුක්ත කලාපය සේ නම් කර ඇති වර්ග කිලෝමීටර 14ක භූමි ප්‍රදේශයේ සිරවී සිටින 100,000 පමණ වූ සිවිල් වැසියන් ගේ ජීවිත ආරක්ෂාව සම්බන්ධයෙන් තමා දැඩි අවධානයක් යොමු කරන බව ඔහු ප්‍රකාශ කර සිටියේය. සිවිල් වැසියන් විශාල සංඛ්‍යාවක් දැනට මත් මියගොස් හෝ තුවාල ලබා සිටියි. වාර්තාවලට අනුකූලව එල්ටීටීඊ සාමාජිකයක් දැන් දැන් යුද මුක්ත කලාපය දෙසට ඇදෙමින් සිටින අතර මේ හේතුව නිසාම සිවිල් ජීවිත විනාශ වීමේ දැඩි අවදානමක් ඇති බව ඔහු ප්‍රකාශ කළේය. සිවිල් වැසියන්ට ආරක්ෂිතව වෙනත් ප්‍රදේශවලට යාමෙ ඉඩකඩ ලබා දෙන ලෙස ඔහු එල්ටීටීඊ සංවිධානයෙන් අවධාරණය කර ඉල්ලා සිටියේය. යුද මුක්ත කලාපයේ සිවිල් වැසියන් රැඳී සිටින බැවින් ඒ ප්‍රදේශවල යුධ කටයුතු කිරීම සම්බන්ධයෙන් සැලකිලිමත්වන ලෙස ද ඔහු රජයේ ආරක්ෂක හමුදාවලින් ඉල්ලා සිටියේය.

අලුත් අවුරුදු සමයේ එනම් අප්‍රේල් 13 වැනි හා 14 වැනි දිනවල සිවිල් වැසියන්ට යුද කලාපයෙන් පිටතට පැමිණිය හැකි අන්දමට රජය විසින් දෙදිනක සටන් නැවැත්මක් සිදු කර තිබුණි. මෙයට දෙපාර්ශ්වයෙන් ම ගරු කෙරුණු අතර එක්සත්

ජාතීන්ගේ මහලේකම් බැංකි මූන් ගේ ද පැසසුමට ලක් විය.

අන්තර්ජාතික රතුකුරුස සංවිධානය අප්‍රේල් 20 වැනි දින සිදු කරන ලද ප්‍රකාශයකට අනුව පෙබරවාරි 10 වැනි දින සිට මේ දක්වා තුවාල ලත් හා අසනීප තත්ත්වයන්ගෙන් පෙළෙන සිවිල් වැසියන් 10,000 අධික ප්‍රමාණයක් රතු කුරුස සංවිධානය මගින් එල්ටීටීඊ පාලන පුදුමාතලන් ප්‍රදේශයෙන් ඉවත් කර ගෙන තිබේ. ග්‍රීන් ඕෂන් හා සේරුවිල යන මගී නෞකා මගින් ගමන් වාර 23 කදී සිවිල් වැසියන් ත්‍රිකුණාමලයේ හා පුල්මුඩෙයි රජයේ පාලන ප්‍රදේශවලට රැගෙන විත් ඇති අතර මේ සෑම ගමන් වාරයක දී ම මගින් 400 අධික ප්‍රමාණයක් ගෙනැවිත් තිබේ. මේ ඉවත් කර ගැනීම් නිසා බොහෝ දෙනෙකුගේ ජීවිත ආරක්ෂා වී ඇති අතර අසනීපවලින් පෙළෙන අයට හා තුවාල ලැබූවන්ට සහන සැලසී තිබේ.

ආරක්ෂිත කලාපයේ රජයේ හමුදාවලින් සිදු කරන ලද මෙහෙයුම්වලින් පසුව අභ්‍යන්තර අවතැන්වූවන්ට රජයේ පාලන ප්‍රදේශවලට පැමිණීම සඳහා මාර්ගයක් විවර කිරීම අප්‍රේල් 20 වැනි දා සිදු විය. එල්ටීටීඊ වෙඩි ප්‍රහාර මධ්‍යයේ සිවිල් වැසියන් දහසකුත් දෙනා මේ මාර්ගය ඔස්සේ රජයේ පාලන ප්‍රදේශ කරා ඇදී එන්නට වූ අතර එල්ටීටීඊ සංවිධානය විසින් සිදු කරන ලද මරාගෙන මැරෙන ප්‍රහාර තුනක් නිසා සිවිල් වැසියන් 17 දෙනෙකු ජීවිතක්ෂයට පත් වී 200 අධික පිරිසක් තුවාල ලබා ඇත.

වව්නියාවේ අභ්‍යන්තර අවතැන්වූවන්ට සහන සැපයීම් සඳහා රජය විසින් කාර්ය මණ්ඩල හා උපකරණ වැඩි වශයෙන් ලබා දී තිබේ. අභ්‍යන්තර අවතැන්වූවන් සම්බන්ධ කටයුතු සොයා බැලීමේ සම්බන්ධීකාරක වශයෙන් මේජර් ජෙනරල් ජී.ඒ චන්ද්‍රසිරි මහතා පත් කර ඇත.

එක්සත් ජාතීන්ගේ සහන කටයුතු පිළිබඳ සම්බන්ධීකාරක ජෝන් හෝම්ස් මහතා අප්‍රේල් 26 වැනි දින දෙදින සංචාරයක් සඳහා ශ්‍රී ලංකාවට පැමිණියේය. ඔහු රජයේ වගකිව යුතු පාර්ශ්ව හමු වීම මෙන් ම කඳවුරුවල සංචාරය කිරීම හා ඕමන්තෙයි මුරපොළ නිරීක්ෂණය කිරීම ද සිදු කළේය. අර්බුද පවතින කලාපයේ ඇගයීමක් සිදු කිරීමට එක්සත් ජාතීන්ගේ කණ්ඩායමකට එයට ඇතුළු වීමේ අවසර ලබා දෙන මෙන් එක්සත් ජාතීන්ගේ සහන කටයුතු පිළිබඳ සම්බන්ධීකාරක ඉල්ලා සිටියේය. කෙසේ වෙතත් එයට අදාළ පාර්ශ්ව විසින් මේ දක්වා ප්‍රතිචාර දක්වා නොමැත. එක්සත් ජාතීන්ගේ මානුෂීය සේවා කණ්ඩායම විසින් දක්වන ආකාරයට එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලයේ 14 දෙනෙකුට හා වෙනත් රාජ්‍ය නොවන සංවිධානවල කාර්යමණ්ඩලවල 207 දෙනෙකුට යුද මුක්ත කලාපයෙන් පිටවීමට නොහැකි වී තිබේ. ඔවුන් නිදහස් කර ගැනීමට කටයුතු කරන ලෙස ඔහු රජයෙන් ඉල්ලා සිටියි. CERF මගින් සහන සේවා කටයුතු වෙනුවෙන් ඇමරිකානු ඩොලර් මිලියන 10 වෙන් කර ඇති බව ජෝන් හෝම්ස් ප්‍රකාශ කළේය.

ඔක්තෝබර් 27 සිට අප්‍රේල් 27 දක්වා වන කාලසීමාව තුළ අර්බුද පවතින කලාපයේ සිට සිවිල් වැසියන් 151,231 පැමිණ ඇති බවට වාර්තා වී තිබේ. මේ අතරින් 149,421 දෙනෙක් උතුරේ තාවකාලික කඳවුරුවල රඳවා ඇත. පවුල් 31,040 ක පුද්ගලයින් 138,203 දෙනෙකු වව්නියාවේ කඳවුරු 23 ක හා මන්නාරමේ කඳවුරු 3 ක ද පවුල් 3698ක පුද්ගලයින් 11,166 දෙනෙකු යාපනයේ කඳවුරු 12ක දී ද 5414 දෙනෙකු ත්‍රිකුණාමලයේ ද රඳවා ඇත. අප්‍රේල් 27 වැනිදා වන විට අභ්‍යන්තර අවතැන්වූවන් 1,810 සංඛ්‍යාවක් විවිධ දිස්ත්‍රික්කවල රෝහල්වලට ඇතුළු කර තිබේ.

දිනෙන් දින අලුතින් පුද්ගලයින් පැමිණීම සිදු වන නිසා සමහර අභ්‍යන්තර අවතැන්වූවන්ගේ කඳවුරුවල ඉඩකඩ ඇහිරී ඇති ආකාරය පෙනේ. වව්නියාවේ කඳවුරුවල වැසියන් 5 දෙනෙක් පමණක් සිටිය යුතු කූඩාරම්වල වැසියන් 18 දෙනෙක් පමණ සිටින අතර එක්සත් ජාතීන්ගේ මානුෂීය කණ්ඩායම දක්වන අන්දමට මෙහි ජල පහසුකම් සීමිතය.

ගැටුම් පවතින කලාපයේ මෙන් ම කඳවුරුවල ද සෞඛ්‍ය පහසුකම් ගැටලුවක් ව පවතියි. මේ කලාපයන් තුනේ එක බැගින් ක්ෂේත්‍ර රෝහල් ස්ථාපනය කිරීම සිදුවන බව CA විසින් දක්වා ඇති අතර මේ රෝහල්වල පැය 24 සේවයට සුදානම්ව වෛද්‍යවරු දෙදෙනෙක් වෙන්කරන ලෙස සෞඛ්‍ය බලධාරීන්ගෙන් ඉල්ලීම් කර තිබේ. ප්‍රංශ සිවිල් ආරක්ෂක අංශ මගින් චුන්ඩිකුලම් හි ක්ෂේත්‍ර රෝහලක් පවත්වාගෙන යන අතර මෙහි වෛද්‍ය කාර්ය මණ්ඩලය 30 දෙනෙකුගෙන් සමන්විත වේ. මෙයට විශේෂඥයින් 4 දෙනෙක් ඇතුළත් වේ.

කඳවුරුවල සනීපාරක්ෂාව හා ජල පහසුකම් අවම මට්ටමක පවතින අතර මේවා අන්තර්ජාතික සම්මතයන්ට කිසිසේත් ම අනුකූල නොවේ. WASH සංවිධානය විසින් තක්සේරු කර ඇති ආකාරයට දිනෙන් දින වැඩිවන අභ්‍යන්තර අවතැන්වූවන්ගේ අවශ්‍යතා සැපිරීම සඳහා අතිරේක වතුර බවුසර 20ක් අවශ්‍ය වේ. එසේම දැනට වතුර බවුසර 55 භාවිත වේ.

අභ්‍යන්තර අවතැන්වූවන්ගේ හදිසි අවශ්‍යතාවලට ප්‍රතිචාර දක්වීම සඳහා රජය විසින් මැනික්ෆාම් කලාප අංක දෙකේ කාර්යාලයක් පිහිටුවමින් සිටියි. මෙය පොළොන්නරුවේ හා මහනුවර දිස්ත්‍රික්ක ලේකම් විසින් පවත්වාගෙන යනු ලැබේ.

හැකි තාක් කඩිනමින් ටොන් 30 ආහාර තොග රැගත් නෞකා ත්‍රිකුණාමලයේ සිට ගැටුම් පවතින ප්‍රදේශ කරා යැවීමට අන්තර්ජාතික රතුකුරුස සංවිධානය පියවර ගනිමින් සිටියි. එසේම තුවාල ලැබූවන් මේ ප්‍රදේශවලින් ඉවත් කර ගැනීමට ද නියමිතය.

## බාහිර ක්‍රියාකාරීන්

**මේ** මාසයේ සුවිශේෂ සිදුවීම් කිහිපයක් වාර්තා විය. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ සාමාජිකයින් සමග ශ්‍රී ලංකාව නිල නොවන සාකච්ඡා කිහිපයක් පවත්වා තිබේ. අමාත්‍යවරුන්, විදේශ නියෝජිතයින් ආදී බොහෝ පුද්ගලයින් විටින් විට පැමිණ ඇති අතර අන්තර්ජාතික දුරකථන ඇමතුම් ද රාශියක් හුවමාරු වී තිබේ. මේ සියල්ලට ම එක් පොදු තේමාවක් විය. එනම් ගැටුම් පවතින කලාපයේ සිටින සිවිල් වැසියන් පිළිබඳ ගැටලුවයි. එමෙන් ම සටන් විරාම පිළිබඳ කතාබහ ද සිදු විය. අන්තර්ජාතික මතය අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ ණයවලට බලපෑ හැකි බවට ද මත ඉදිරිපත් විය. මේ අතර ඉන්දියාවේ සිට කූඩාරම්, සාරි, සරම් මෙන් ම භාජන ආදිය ඇතුළත් පාර්සල් 40,000 අධික ප්‍රමාණයක් රැගෙන ආ පිරිසක් ද විය. කිසිම මාධ්‍යවේදියෙක් ශ්‍රී ලංකාවෙන් පිටව ගිය බවට වාර්තා නොවේ. අල් ජසීරා පුවත් සේවය මගින් ආන්දෝලනාත්මක පුවත් පළ කරනු දක්නට විය. විදේශයන් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලට ප්‍රහාර එල්ල වූ ආකාරය දක්නට වූ අතර ලන්ඩනයේ ඉන්දියානු ආයතනයේ තිබූ නේරු තුමාගේ හිස කඩා බිඳ දමා තිබේ. මේ සියලු කාරණා නිසා අප්‍රේල් මාසය වැදගත් කාල සීමාවක් සේ හැඳින්විය හැකිය.

# දිස්ත්‍රික්ක විශ්ලේෂණ - 2009 මාර්තු 28 - 2009 අප්‍රේල් 28

## අම්පාර

### ව්‍යූහයන්

**මා**යිම් ගම්මානවල ගොවියන් කිහිප දෙනෙක් ම්ලේච්ඡ ලෙස ඝාතනය කිරීම නිසා දිස්ත්‍රික්කය තුළ පැවති සාමකාමීබවට පහරක් එල්ල වී තිබේ. මේ නිසා ප්‍රජාවන් අතර වූ හොඳ හිත පළුදු වී කිසියම් ආකාරයක ආතතිමය තත්වයක් ඇති කිරීම සිදු වී ඇත. මායිම් ගම්මානවල වරින් වර විවිධ ආරක්ෂක සිදුවීම් ද වාර්තා වී තිබේ. අවධානයට ලක් වී ඇති කාල සීමාව තුළ ආරක්ෂක හමුදා විසින් එල්ටීටීඊ සාමාජිකයින් 13 වෙඩි තබා ඝාතනය කර ඇත.

කරුණා හා ටීඑම්වීපී සාමාජිකයන් අතර පවතින මතභේද දිගින් දිගටම පවතියි. භාරතී මහතා ජනාධිපතිතුමාගේ නැගෙනහිර පළාත හා සම්බන්ධ ලේකම් වශයෙන් පත් කිරීම ද වැදගත් සිදුවීමක් බවට පත් වී තිබේ. භාරතී මහතා විසින් රාජ්‍ය නොවන සංවිධානවල කටයුතු දැඩි සේ නිරීක්ෂණය කරනු ලැබීම එම සංවිධානවල සතුටට හේතු වී නොමැත. මේ අතර රාජ්‍ය නොවන සංවිධාන කිහිපයක් ම සිය ව්‍යාපෘති කටයුතු හා කාර්ය මණ්ඩල සීමා කරනු දැකිය හැකි විය. දිස්ත්‍රික්කයේ වෙරළාසන්න ප්‍රදේශවලට මානුෂීය හා සංවර්ධන සේවාවන් අවශ්‍යව සිටින අවස්ථාවක මෙසේ සිදුවීම අවාසිදායක තත්ත්වයකි.

### ක්‍රියාකාරීන්

රාජ්‍ය බලධාරීන්, රජයේ ආරක්ෂක අංශ හා එල්ටීටීඊ සංවිධානය දැනට පවතින සන්දර්භය තුළ ප්‍රධාන ක්‍රියාකාරීන් සේ සැලකිය හැකි වේ.

### ක්‍රියාත්මකවන ආකාරය

මායිම් ගම්මානවල ගොවීන් දරුණු ලෙස ඝාතනය කරනු ලැබීම නිසා මිනිසුන් තුළ පැවති විශ්වාසයට පහර එල්ල වී තිබේ. කෙටි කාලයකට හෝ දිස්ත්‍රික්කය තුළ පැවති සාපේක්ෂ සාමකාමී තත්ත්වයට ද මෙයින් හානි සිදු වී ඇත. සිය ආරක්ෂාව සම්බන්ධයෙන් සිවිල් වැසියෝ නැවතත් බියට පත්ව සිටින අතර, සිය නිවෙස්වලින් පිටතට යාමට පැකිලෙති. මෙය ප්‍රජාවන් අතර පවතින පහසුවෙන් බිඳෙන සුළු සාමකාමී බවට අයහපත් සේ බලපෑම් ඇති කළ හැකි අතර ඒ තුළින් රජයේ සංවර්ධන කටයුතුවලට අයහපත් බලපෑම් ඇති කළ හැකිය. ප්‍රජාවන් එකිනෙකා විශ්වාස නොකරන තත්ත්වයක් ගොඩනැගීම නිසි ඔවුන්ට සංවර්ධනය වෙනුවෙන් එකමුතුව කටයුතු කළ නොහැකි වනු ඇත.

### ක්‍රමෝපායන් හා විකල්ප

බලධාරීන් සිවිල් වැසියන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් වැඩිපුර අවධානයක් යොමු කළ යුතු වේ. ප්‍රජාවන් අතර ඇතිවිය හැකි අසමගිය සංවර්ධන ක්‍රියාදාමයේ දී අයහපත් සේ බලපෑමට ඉඩ තිබේ. මායිම් ගම්මානවලට වැඩි අවධානයක් යොමු කළ යුතු වන්නේ මේවා එල්ටීටීඊ ප්‍රහාර වලට ලක්වීමේ දැඩි අවදානමක් ඇති බැවිනි.

රාජ්‍ය නොවන සංවිධාන කෙරෙහි අහඹු ලෙස පනවන නීති රීති වඩාත් ක්‍රමවත් කිරීම සඳහා දිස්ත්‍රික්කය තුළ කටයුතු කරන රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධයෙන් පොදු රාමුවක් සකස් කිරීම වැදගත්ය. මෙමගින් ගැඹුරු අන්‍යෝන්‍ය අවබෝධයක් ලබා ගත හැකි වනු ඇති අතර මෙය දිස්ත්‍රික්කයේ මානුෂීය මෙන්ම සංවර්ධන කටයුතු වෙනුවෙන් ප්‍රතිලාභදායී වනු ඇත.

# මඩකලපුව

**ව්‍යූහයන්**

අසල්වැසි දිස්ත්‍රික්කවලට සාපේක්ෂව මඩකලපුව සාමාකාමී වාතාවරණයක් අත්විඳියි. දිස්ත්‍රික්කයේ ආරක්ෂක අංශ ශක්තිමත්ව සිටින අතර අඳුර වැටීමෙන් පසු ව වුවත් නිවස්වලින් පිට වී සිටීමට තරම් ජනතාව තුළ විශ්වාසය වර්ධනය වී තිබේ. මිනී මැරුම්, පැහැරගෙන යාම් හා ඒ ආකාරයේ සෙසු පැරා මිලිටරි ක්‍රියාකාරකම් සැලකිය යුතු ලෙස අඩු වී ඇත. එසේම දේශපාලන කණ්ඩායම් අතර ගැටුම් ද අඩු වී තිබේ. මෙවන් තත්ත්වයක් යටතේ ප්‍රජා සම්බන්ධතා වැඩි දියුණු වී ඇති අතර සංවර්ධන කටයුතුවලදී ප්‍රජාව සහයෝගයෙන් කටයුතු කරනු පෙනේ.

කරුණා විසින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උප සභාපති ධූරය භාර ගැනීම දිස්ත්‍රික්කය තුළ සංවාදයට බඳුන් වී තිබේ. විශේෂයෙන් ම මේ තුළින් නැගෙනහිර පළාතට ඇති විය හැකි බලපෑම සාකච්ඡාවට භාජනය වී ඇත. සමහර ටීඑම්වීපී කාර්යාලවල, ඒවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂ කාර්යාල බව පළ කෙරෙන පුවරු දක්වා ඇත. මේ වෙනස් වීම ගැන ටීඑම්වීපී සාමාජික-යන් අවධානයෙන් යුතුව සිටින්නේ මෙහි ප්‍රතිඵලයක් සේ පක්ෂය තුළ කිනම් වෙනස්කම් සිදුවේ දැයි යන සැකයෙනි.

මේ අතර දැරියක පැහැරගෙන යාම දිස්ත්‍රික්කය තුළ ප්‍රකෝපකාරීබවක් ඇති කිරීමට හේතු වී තිබේ. පැහැරගෙන ගිය ජූඩ් වර්ෂා රෙජී දැරිය මරා දමා තව ම එතරම් කාලයක් ගත වී නොමැත. 13වන සංශෝධන ස්ථාපනය කිරිම සම්බන්ධ විවාදය කල් දැමීම දිස්ත්‍රික්කය තුළ අප්‍රසාදයට ලක් වී ඇත.

**ක්‍රියාකාරීන්**

පාර්ලිමේන්තු මන්ත්‍රී කරුණා, රාජ්‍ය බලධාරීන්, රජයේ ආරක්ෂක අංශ හා රාජ්‍ය නොවන සංවිධාන දිස්ත්‍රික්කය තුළ ප්‍රධාන ක්‍රියාකාරීන් සේ සිටියි.

**ක්‍රියාත්මකවන ආකාරය**

කරුණා විසින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උප සභාපති ධූරය භාර ගැනීම නිසා ටීඑම්වීපී පක්ෂය තුළ කිනම් වෙනස්කම් ඇති වේ දැයි පාක්ෂිකයෝ දැඩි අවධානයෙන් යුතුව සිටිති. මේ වෙනස්කම්වලින් පක්ෂයට ඇති විය හැකි බලපෑම කුමනාකාර වේ දැයි ඔවුහු මග බලා සිටිති.

13වන සංශෝධන ස්ථාපනය කිරිම සම්බන්ධ විවාදය කල් දැමීම දිස්ත්‍රික්කය තුළ ප්‍රධාන මාතෘකාවක් බවට පත් වී තිබේ.

වන්නි ප්‍රදේශයේ ගැටුම් සිදුවන අතරතුර මඩකලපු දිස්ත්‍රික්කය දශක තුනක් පුරා පැවති යුද්ධය අවසන් වන තෙක් බලා සිටියි. මෑතක දී අම්පාරේ මායිම් ගම්මානවල සිදු වූ ප්‍රහාර නිසා මඩ කලපුවේ ද ආරක්ෂාව පිළිබඳ සැලකිල්ල යොමු ව ඇත.

**ක්‍රමෝපායන් හා විකල්ප**

මෑතක දී අම්පාරේ සිදු වූ ප්‍රහාර ගැන සලකා බලන විට මඩකලපු දිස්ත්‍රික්කයේ ද ආරක්ෂාව සම්බන්ධයෙන් දැඩි අවධානයකින් යුතුව සිටීම වැදගත්ය. දැනට දිස්ත්‍රික්කය තුළ ආරම්භ කර ඇති සංවර්ධන ව්‍යාපෘති ඉදිරියට ගෙන යෑමට ප්‍රජාවන් හා ප්‍රාදේශීය බලධාරීන් එක්ව කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ.

# කොළඹ

**ව්‍යූහයන්**

වාර්තා කරන කාලසීමාව තුළ කොළඹ දිස්ත්‍රික්යේ තත්ත්වය ස්ථාවරව පැවතිණි. මේ කාලයේ දිස්ත්‍රික්කයේ ප්‍රධාන මාතෘකාව වූයේ බස්නාහිර පළාත් සභා මැතිවරණයයි. මැතිවරණ නිරීක්ෂන සංවිධානයක් වන පැෆරල් සංවිධානය විසින් වාර්තා කරන ලද අන්දම ට මැතිවරණ දූෂණ ක්‍රියා විශාල ගණනක් දක්නට ලැබුණු අතර වෙඩි තැබීම් හා ඝාතන දෙකක් ද වාර්තා වී තිබේ. කෙසේ වෙතත් ඡන්ද දායකයින් මිලියන 1.4 පමණ ඡන්දය ප්‍රකාශ කර නොමැති බව වාර්තා වී ඇත.

කසල එක්රැස් කිරීම දිස්ත්‍රික්කය මුහුණ පා ඇති විශාල ම ගැටලුව බවට පත් වී තිබේ. වීදිවල කසල ගොඩගැසී තිබුණේ සෞ ඛ්‍යාරක්ෂාවට තර්ජන ඇති කරමිනි. කුණු බැහැර කිරීම සඳහා ස්ථිර භූමි භාගයක් නොමැති අතර නිතර තාවකාලික භූමි භාගයන් භාවිත කිරීම සිදු වූ අතර මේ නිසා වීදිවල කුණු කඳු ගොඩගැසීම සිදු විය.

දිස්ත්‍රික්කය පුරා වරින් වර සෝදිසි මෙහෙයුම් සිදු විය. සිංහල අලුත් අවුරුදු සමයේ දී සාප්පු සවාරිවල යෙදෙන පුද්ගලයින් ගණන සැලකිය යුතු ලෙස අඩු වී තිබූ අතර ඉහල යන ජීවන වියදම මෙයට හේතු වන්නට ඇත. අලුත් අවුරුදු සමයේ ක්‍රියාත්මක වූ මධ්‍යම ගමනාගමන මණ්ඩල බස් වර්ජනය නිසා ජනතාවට දුෂ්කරතාවලට මුහුණ පෑමට සිදු විය.

මේ අතර දිස්ත්‍රික්කය තුළ ඩෙංගු වසංගතය දරුණු ලෙස හිස ඔසවමින් සිටියි.

**ක්‍රියාකාරීන්**

රජය, දේශපාලන පක්ෂ හා ආරක්ෂක අංශ වත්මන් සන්දර්භය තුළ ප්‍රධාන ක්‍රියාකාරීන් සේ සිටියි.

**ක්‍රියාත්මකවන ආකාරය**

දිස්ත්‍රක්කය තුළ ක්‍රියාත්මකවන ආකාරයට ප්‍රධාන වශයෙන් ම බලපෑම් සිදු කර ඇත්තේ මෑතක දී පැවති බස්නාහිර පළාත් සභා මැතිවරණයයි. ඡන්ද දිනා ගැනීම සඳහා තරගකරුවන් විසින් අලවන ලද පෝස්ටර් හා බැනර්වලින් නගරය පිරී පවතියි. දැනට පවතිය යුද තත්ත්වය පිළිබඳ සොයා බැලීමට විදේශ නියෝජිතයින් පැමිණීම ද දිස්ත්‍රික්කය තුළ සාකච්ඡාවට භාජනය වී තිබේ. ජාතික විපතක දී අන්තර්ජාතික මැදිහත් වීමට විරෝධය පාමින් ඇතැම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විරෝධය පළ කිරීම හමුවේ මෙය සිදු වී තිබේ. කෙසේ වෙතත් විදෙශ්හ නියෝජිතයින්ගේ ප්‍රකාශයන්ට අනුව ඔවුන්ගේ අවධානය යොමු වී ඇත්තේ යුද මුක්ත කලාපයේ සිර වී සිටින සිවිල් වැසියන් වෙත හා අභ්‍යන්තර අවතැන්වූවන් වෙතය. ආර්ථික වශයෙන් සලකා බලද්දී ලෝක ආර්ථික අර්බුදය රට තුළට පිවිසෙන අයුරු දැකිය හැකි වේ. ඇඟලුම් කම්හල් කිහිපයක් හා සුළු පරිමාණ ව්‍යාපාර වැසී ගොස් තිබේ. මෙහි ප්‍රතිඵලයක් සේ රැකියා විරහිතභාවය ඇති වී ඇත.

**ක්‍රමෝපායන් හා විකල්ප**

ඩෙංගු රෝගය හිස එසවීම වළක්වා ගැනීමට නම් එම රෝගයේ මාරාන්තිකබව පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට වැඩසටහන් දියත් කිරීම වැදගත් වේ. මෙම රෝගය කාර්යක්ෂම ලෙස මර්ධනය කිරීම සඳහා පුද්ගලයින් පුහුණු කිරීම හා ඒ වෙනුවෙන් අරමුදල් වෙන් කිරීම කෙරෙහි සෞඛ්‍ය අමාත්‍යංශය අවධානය යොමු කළ යුතු වේ.

# යාපනය

**ව්‍යූහයන්**

යාපනයේ ආරක්ෂක තත්වය ස්ථාවරව පවතිද්දී වරින්වර සෝදිසි මෙහෙයුම් සිදුවන්නේ මුලතිව්හි සිදුවන දරුණු ගැටුම් හේතුවෙනි. සෙසු දිස්ත්‍රික්කවල මෙන් ම යාපන දිස්ත්‍රික්කයේ ද පැරා මිලිටරි ක්‍රියාකාරකම් සිදු වෙමින් පවතින අතර අහඹු ලෙස සිදුවන ඝාතන හා පැහැරගෙන යාම් දක්නට ලැබේ.

A-9 මාර්ගය විවෘත කිරීමත් සමග කොළඹ සිට යාපනයට අත්‍යවශ්‍ය ද්‍රව්‍ය හා සෙසු නිෂ්පාදන ප්‍ර වාහනය කිරීමට ඉඩකඩ සැලසීම නිසා ආහාර හා කෘෂි කාර්මික ද්‍රව්‍යවල මිල පහළ ගොස් ඇත. යාපනයේ සිට කොළඹටත් ප්‍රවාහන මාර්ග විවෘත වී ඇති බැවින් යාපනයේ වෙළඳ කටයුතු දියුණු වී තිබේ.

මේ ප්‍රදේශයේ බෙහෝ දෙනෙකුගේ නෑ හිත මිතුරන් මුලතිව් හා කිලිනොච්චි ප්‍රදේශවල සිටින අතර ඒ ප්‍ර දේශවල ඇති ගැටුම් නිසා ජනතාව ඔවුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් බියට පත් වී සිටිති.
මේ අතර තව මාස දෙකක් ඇතුළත උතුරේ ප්‍රාදේශිය සභා මැතිවරණ පැවැත්වීමට අදහස් කරන බවට රජය විසින් කරන ලද ප්‍රකාශයට විවිධ ප්‍රතිචාර පළ වෙමින් තිබේ. මේ තරම් කඩිනමින් රජයට සිය අරමුණ සාක්ෂාත් කර ගැනීමට හැකිවේ දැයි ජනතාව සැක පළ කරති. අනෙත් අතට මැතිවරණයක් පවත්වන්නේ නම් ඡන්ද අපේක්ෂකයන්ගේ මෙන් ම ඡන්ද දායකයන්ගේ ද ආරක්ෂාව තහවුරු කළ යුතු වේ.

**ක්‍රියාකාරීන්**

රජය, රජයේ ආරක්ෂක අංශ, රාජ්‍ය නොවන සංවිධාන හා වෙළඳුන් ප්‍රධාන ක්‍රියාකාරීන් වේ.

**ක්‍රියාත්මකවන ආකාරය**

දශක තුනක් පුරා පැවති යුද්ධය කඩිනමින් අවසන් වන තෙක් ජනතාව බලා සිටිති. එසේම දීර්ඝ කාලීන වශයෙන් නොපැවති සාමය කඩිනමින් මුළු රට පුරාම ව්‍යාප්ත වනු දැකීම ජනතා අපේක්ෂාවයි.
A-9 මාර්ගය විවෘත වීම වෙළඳ කටයුතු කෙරෙහි යහපත් බලපෑමක් ඇති කර තිබේ. වව්නියාවේ සිට දුම්රිය මාර්ගය නැවත ඉදිකිරීමට පියවර ගැනීම නිසා දශක තුනක කාලයක් තිස්සේ තමාට අහිමිව තිබූ යහපත් ජීවිත නැවත හිමිවනු ඇති බවට ජනතාව තුළ අපේක්ෂා දල් වී ඇත.

**ක්‍රමෝපායන් හා විකල්ප**

උතුර නැවත ගොඩනැගීමේ උතුරු වසන්තය වැඩස-ටහන කඩිනම් කිරීමට පියවර ගත යුතුය. එසේම ජනතාවගේ ජීවන තත්වයන් නගා සිටුවීම කෙරෙහි ද අවධානය යොමු කළ යුතුය. ආදායම් උපයන මාර්ග ජනනය කිරීම තුළින් හා සාමය නගා සිටුවන වැඩස-ටහන් තුළින් මෙය ඵලදායී ලෙස ඉටු කර ගත හැකිය. යාපනයේ අභ්‍යන්තර අවතැන්වූවන් වෙනුවෙන් මූලික සෞඛ්‍ය පහසුකම්, පෝෂණය හා මූලික අවශ්‍යතා සැපයිය යුතු වේ.

# මන්නාරම

### ව්‍යුහයන්

**මේ** දක්වා වව්නියාවේ, ත්‍රිකුණාමලයේ හා පුල්මුඩේ සිට මන්නාරම රෝහලට රෝගීන් 1600 අධික සංඛ්‍යාවක් රැගෙන විත් තිබේ. රෝහල් කාර්ය මණ්ඩලයට උපකාර කිරීම සඳහා රාජ්‍ය නොවන සංවිධාන, ආගමික ආයතන, මහජන සංවිධාන ආදිය කැප වී සිටීම පැසසිය යුතුය. මේ සංවිධාන ආහාර සැකසීම, රෙදි සේදීම, රෝහල් පරිශ්‍රය නඩත්තු කිරීම ආදී කටයුතු සිදු කරයි.  පලාත් සෞඛ්‍ය සේවා නියෝජ්‍ය අධ්‍යක්‍ෂක විසින් වාර්තා කරන අන්දමට මේ වන විට 2009 සඳහා වෙන්කරන ලද මුදල් ප්‍රමාණය ඉක්මවා ගොස් ඇත. තව දුරටත් ඔවුන් ඉල්ලා සිටින්නේ රෝහලින් මුදා හරින ලද රෝගීන් පුනරුත්තාපනය සඳහා කඳවුරු වෙතට යවන ලෙසයි.

අභ්‍යන්තර අවතැන්වූ පවුල් 5000 මන්නාරමට රැගෙන ඒමට වන සැලසුම් දැනට ක්‍රියාත්මක වෙමින් තිබේ. මේ පවුල්වලට පහසුකම් සැපයීම සඳහා පාසැල් දෙකක් වෙන් කර ඇත. අභ්‍යන්තර අවතැන්වූවන් පදිංචි කරවීම සඳහා දැනට වල් වැවී ඇති ගම්මානයක් හෙලි පෙහෙලි කිරීමේ සැලසුම්ද සකස් කෙරෙමින් පවතියි.

මැදවච්චිය මුරපලෙන් සිවිල් ජනතා ගමනාගමනය සීමා කර තිබේ. සිවිල් වැසියන් බොහෝ දෙනෙකුට මුරපල පසු කර පැමිණීමට නොහැකි වී ඇත. මෙසේ ගමනාගමනය සීමා කළ අය අතුරෙන් බොහෝ දෙනා දෙමළ ජාතිකයන් වන අතර මේ නිසා ඔවුහු අසතුටට පත් ව සිටිති. කෙසේ වෙතත් සිංහල හා මුස්ලිම් වැසියන්ට මුරපොළින් පිටවීමේ අවස්ථාව ලබා දී තිබේ. රජයේ හමුදා විසින් ඇතුළු වීමට ඉඩ ලබා නොදීම නිසා මඩු දේවස්ථානයට යා නොහැකි වීම සම්බන්ධයෙන් කතෝලික ප්‍රජාව අප්‍රසාදය පළ කරති. මේ අතර අභ්‍යන්තර අවතැන්වූවන්ගෙන් 19 දෙනෙකුට ඉන්දියාවේ රැකවරණ ලැබී ඇත.

දිස්ත්‍රික්කයේ පැරා මිලිටරි ක්‍රියාකාරකම් දිගටම සිදු වේ. පැහැරගෙන යාම් 5ක් හා ඝාතනයක් වාර්තා වී තිබේ. කතෝලික පල්ලිය මගින් පවත්වාගෙන යන වැඩිහිටි නිවාසවල කඳවුරුවලින් මුදා හැරුණු වැඩිහිටියන් 100ක් රැඳවීමට සැලසුම් සකස් කෙරෙයි.

### ක්‍රියාකාරීන්

පුනරුත්තාපනය කිරීමේ අමාත්‍යංශය, රජයේ නිළධාරීන්, ආරක්ෂක අංශ, රාජ්‍ය නොවන සංවිධාන, කතෝලික පල්ලිය හා අභ්‍යන්තර අවතැන් වූවන් ප්‍රධාන ක්‍රියාකාරීන් සේ සිටියි.

### ක්‍රියාත්මකවන ආකාරය

මන්නාරම රෝහලේ ආහාර පිසීම, රෙදි සේදීම ආදී කටයුතු සඳහා ස්වේච්ඡා මහජන සේවකයින් ඉදිරිපත් වී ඇති ආකාරය දක්නට ලැබේ. කතෝලික පල්ලියේ ඉල්ලීමකට අනුව මෙම පිරිස ඉදිරිපත් වී ඇත.

දෙමළ වැසියන්ට සංචලන සීමා පනවා තිබීම නිසා සිය පෞද්ගලික කටයුතු  ඉටු කර ගැනීම නොහැකි වීමෙන් ඔවුහු අතෘප්තියට පත් ව සිටිති. වෙනත් ප්‍රදේශවලට යාම හා සම්බන්ධ හේතු දිස්ත්‍රික්ක ලේකම් විසින් පැහැදිලිව දැක්වීම හා එම අවශ්‍යතා සම්බන්ධයෙන් නිසියාකාර සාක්ෂි දැක්වීම මගින් මේ තත්ත්වය කිසියම් දුරකට පාලනය කළ හැකි වේ.

පැරා මිලිටරි ක්‍රියාකාරකම් නිසා දිස්ත්‍රික්කයේ නොසන්සුන්බවක් වර්ධනය වෙමින් තිබේ. මේ නිසා බොහෝ දෙනෙක් ඉතා ම හදිසි කාර්යයන්ට හැර නිවෙස්වලින් පිටවීමට පැකිලෙති.

### ක්‍රමෝපායන් හා විකල්ප

මැදවච්චිය මුරපොල පසුකර යාම පිළිබඳව පැහැදිලි නිර්නායක රජය විසින් ඉදිරිපත් කිරීම වැදගත් ය. මෙසේ නිර්නායක ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම නිසා තමාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බව දෙමළ වැසියන්ට හැඟී යා හැකිය.

දිස්ත්‍රික්කය තුළ නීතිය හා සාමය පවත්වා ගැනිමට නම් පැරා මිලිටරි ක්‍රියාකාරකම් පාලනය කිරීමට පොලිසිය පියවර ගත යුතුය.

රජ්‍ය නොවන සංවිධානවලට දිස්ත්‍රික්කය තුළ කටයුතු කිරීමට ඇති අවස්ථා පුළුල් කිරීම මගින් අභ්‍යන්තර අවතැන්වූවන්ට වඩාත් යහපත් ජීවන තත්ත්වයන් ඇති කිරීම මෙන් ම ඔවුන් නිසා රජයට ඇති වී ඇති පීඩනය යම් තාක් දුරකට අඩු කිරීම ද සිදු කළ හැකිය. ලෝක ආහාර අරමුදල මගින් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවන හාල්, පිටි හා ධාන්‍ය වර්ග ලබා දෙමින් සිටින අතර එලවළු, ප්‍රෝටීන් අවශ්‍යතා, කිරි ආහාර, ඇඳුම්, කාන්තාවන්ට අවශ්‍ය උපකරණ හා සෙසු අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ලබා දීමට සෙසු රාජ්‍ය නොවන සංවිධානවල උපකාර ලබා ගත හැකි වේ.

රැකියා උත්පාදනය කෙරෙහි ද දැඩි අවධානයක් යොමු කළ යුතුය. අභ්‍යන්තර අවතැන්වූවන්ගෙන් බොහෝ දෙනා වැඩ කළ හැකි තත්ත්වයේ සිටින අතර තාවකාලික හැඳුනුම්පතක් ලබා දීමෙන් පසු ඔවුන් වී ගොවිතැන, ධීවර කර්මාන්තය ආදී රැකියාවල යෙදවිය හැකිය. මෙමගින් රජයේ බර කිසියම් දුරකට අඩු කළ හැකි අතර විරැකියාව නිසා කඳවුරු තුළ ඇති විය හැකි තරුණ අසහනය දුරු කිරීමට ද හැකි වනු ඇත.

# ත්‍රිකුණාමලය

### ව්‍යුහයන්

**නැ**ගෙනහිර පළාතේ සෙසු දිස්ත්‍රික්ක හා සසඳා බලද්දී ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය ස්ථාවර තත්ත්වයක පවතියි. වන්නියේ සිට අභ්‍යන්තර අවතැන්වූවන් ඇදී එද්දී දිස්ත්‍රික්කයේ ආරක්ෂාව ශක්තිමත් කර තිබේ. වාහන හා සිවිල් වැසියන් සෝදිසි කිරීම ද දැඩි ලෙස සිදු වේ.     ත්‍රිකුණාමල කොළඹ මාර්ගයේ සියලු මගීන් මුරපළවල දී සිය ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර ලියාපදිංචි වීම අනිවාර්ය වේ. දිගින් දිගටම පවතින පැරා මිලිටරි ක්‍රියාකාරකම් නිසා කිසියම් ආකාරයක නොසන්සුන්බවක් පවතියි.

සිය පවුල් කාඩ්පතේ ඇතුළත් වී නොමැති කිසිම කෙනෙක් නිවෙස්වල නවත්වා නොගන්නා ලෙස ත්‍රිකුණාමල ප්‍රදේශවාසීන් ට උපදෙස් ලැබී තිබේ. කිසියම් අයෙක් නිවසේ නවත්වා ගැනිම සිදු වන්නේ නම් අදාළ පුද්ගලයාගේ නම ළඟම ඇති පොලිස් ස්ථානයේ අවසරය සහිත ව පවුල් කාඩ් පතේ ඇතුළත් කළ යුතුය. එසේම ත්‍රිකුණාමලයෙන් පිටත යන අය ද සෑම විට ම සිය පවුල් කාඩ්පත රැගෙන යාම අනිවාර්ය කර ඇත. ආරක්ෂක මුරපළවල දී සිය අනන්‍යතාව තහවුරු කර ගැනීමට නොහැකිව අපහසුවට පත්වීම වැළැක්වීමට මෙම පියවර ගෙන තිබේ.

මඩකලපුවේ සිට ත්‍රිකුණාමලය දක්වා ඍජු දුම්රිය ගමන් වාරයක් ආරම්භ කර ඇත. ඉන්දීය රජය විසින් නැගෙනහිර පළාත් සභාවට රේල් බසයක් පරිත්‍යාග කර තිබේ.

මුලතිව් හි තුවාල ලැබූවන් බොහෝ දෙනෙක් පුල්මුඩෙ රෝහලේ ප්‍රතිකාර ලබා ඇත. දිගින් දිගටම පැමිනෙණ අභ්‍යන්තර අවතැන්වූවන්ට සහන සැපයීමක් වශයෙන් ඔවුන්ට තාවකාලික නිවාස පහසුකම් සැපයීට රජය සැලසුම් සකස් කරමින් සිටියි.

දිස්ත්‍රික්කය තවමත් සය හැවිරිදි ජුඩ් වර්ෂා රෙජී දැරිය අමානුෂික ලෙස ඝාතනය කිරීම පිළිබඳ කම්පාවට පත් වී සිටියි. මේ සම්බන්ධයෙන් නැගි මහජන ප්‍රකෝපය තවමත් ඉහළ මට්ටමක ඇත. දිස්ත්‍රික්කය තුළ සිදුවන පැරා මිලිටර් ක්‍රියාකාරකම්වලට මෙය එක් උදාහරණයක් පමණක් වන අතර මේවා පිටු දැකීමට අවශ්‍ය සියලු ම පියවර ගත යුතු වේ. පසුගිය මසක කාල සීමාව තුළ දී හඳුනා නොගත් තුවක්කුකරුවන් විසින් පස් දෙනෙකු ඝාතනය කරනු ලැබ ඇත.

### ක්‍රියාකාරීන්

රජයේ බලධාරීන්, රජයේ ආරක්ෂක අංශ, රාජ්‍ය නොවන සංවිධාන, අභ්‍යන්තර අවතැන්වූවන් හා පැරා මිලිටරි කණ්ඩායම් ප්‍රධාන ක්‍රියාකාරීන් සේ සිටියි.

### ක්‍රියාත්මකවන ආකාරය

දිස්ත්‍රික්කය තුළ සිදුවන පැරා මිලිටරි ක්‍රියාකාරකම් නිසා ව්‍යාපාරික ප්‍රජාව දැඩි පීඩනයකට ලක්වී සිටිති. මෙය දිස්ත්‍රික්කයේ අයෝජන කෙරෙහි මෙන් ම ව්‍යාපාර සංවර්ධනය කෙරෙහි ද බලපා ඇත. මේ තත්ත්වය නිසා විරැකියාවද ඉහල ගොස් ඇති බව පෙනේ. මේ ප්‍රදේශය තුළ කටයුතු කරන බැංකු ආයතන දක්වන අන්දමට ඔවුන්ගේ ව්‍යාපාර පහළ ගොස් ඇත.

### ක්‍රමෝපායන් හා විකල්ප

පැරා මිලිටරි කටයුතු මැඩ පැවැත්වීමට හැකි සෑම පියවරක් ම ගත යුතු වේ. එමෙන් ම මෙයට සම්බන්ධ පාර්ශ්ව හඳුනාගන්නා ලද අවස්ථාවන් හි දී දැඩි දඬුවම් පැමිණවිය යුතු වේ.

මානුෂීය අර්බුදයක් ඇති වීම වැළැක්වීමට නම් දිනෙන් දින වැඩිවන අභ්‍යන්තර අවතැන්වූවන්ගේ අවශ්‍යතා සම්බන්ධයෙන් සොයා බලා ඇගයීමකට ලක් කළ යුතු වේ.

# වවුනියාව

### ව්‍යූහයන්

ශ්‍රී ලංකා යුද හමුදාව සිවිල් වැසියන් බේරා ගැනීම සිදු කරද්දී තක්සේරු කළ සිවිල් වැසියන් සංඛ්‍යාව වන 100, 000 ඉක්මවන සංඛ්‍යාවක් යුද මුක්ත කලාපයෙන් පිටතට පැමිණ ඇති අතර මේ අය මන්නාරමට හා වව්නියාවට ගෙන ඒමට සැලසුම් සකස් කෙරෙමින් ඇත.

මෙසේ දිනෙන් දින අභ්‍යන්තර අවතැන්වූවන් විශාල සංඛ්‍යාවක් රජයේ පාලන ප්‍රදේශවලට ඇදී ඒම නිසා ඔවුන්ට අවශ්‍ය පහසුකම් සැපයීම් රජයට අභියෝගයක් වී තිබේ. පසුගිය කාල සීමාව තුළ ඔවුන්ට මුහුණ පෑමට සිදු වූ විවිධ දුෂ්කරතා හේතුවෙන් අභ්‍යන්තර අවතැන්වූවන්ගෙන් බොහෝමයක් කම්පනය, ආතතිය ආදී තත්ත්වයන්ගෙන් පෙළෙති. රජය මේ අය මුදා ගැනීම කෙරෙහි සැලසුම් සහගත පියවර අනුගමනය කළ ද මුදා ගැනීමෙන් පසු ඔවුන්ගේ අවශ්‍යතා සැපිරීම සම්බන්ධයෙන් සැලසුම් සහගත පියවර ගෙන නොමැති බව පෙනේ.

මේ අතර ප්‍රදේශයේ ක්‍රියාත්මක වන මානුෂීය හා සහන සේවා ආයතන අභ්‍යන්තර අවතැන්වූවන්ට තාවකාලික නිවාස පහසුකම්, 13,000 අධික සිසු දරුවන් වෙනුවෙන් අධ්‍යාපන පහසුකම්, ජලය, විද්‍යුත් සන්නිවේදනය ආදී මූලික පහසුකම් ලබා දෙමින් සිටියි. එසේම බැංකු, සමූපකාර, තැපැල් කාර්යාල, දරුවන් සඳහා ක්‍රීඩා උද්‍යාන ආදිය ද ලබා දී ඇති අතර අභ්‍යන්තර අවතැන්වූවන් වෙනුවෙන් උපදේශන සේවා සැපයීම ද සිදු කරයි.

මේ අතර අභ්‍යන්තර අවතැන්වූවන් දිගින් දිගට ම බලධාරීන්ගෙන් ඉල්ලා සිටින්නේ මඳකට හෝ කඳවුරෙන් පිටව යෑමට හැකි වන සේ තමාට තාවකාලික හැඳුනුම්පතක් ලබා දෙන ලෙසයි. සිය නෑ හිත මිතුරන්ට කඳවුරුවලට පැමිණීමේ හා උපකාර කිරීමට අවසර ලබා දෙන ලෙසත් රෝගීන්ට කඳවුරුවලින් පිටතින් වෛද්‍ය ප්‍රතිකාර ලැබීමට අවසර ලබා දෙන ලෙස ඔවුහු ඉල්ලා සිටිති.

ප්‍රකට වෛද්‍යවරයකුගේ මරණයක් නිසා රෝහල් වැඩවර්ජනයක් ඇති වූ අතර මෙයට විරෝධය පළ කිරීමක් සේ නගරයේ කඩ සාප්පු වසා දමා තිබුණි.

### ක්‍රියාකාරීන්

පුනරුත්ථාපන අමාත්‍යාංශය, ආරක්ෂක අංශ, අභ්‍යන්තර අවතැන්වූවන්, සහන සේවා සංවිධාන ප්‍රධාන ක්‍රියාකාරීන් සේ සිටියි.

### ක්‍රියාත්මක වන ආකාරය

දිනෙන් දින වැඩිවන අභ්‍යන්තර අවතැන්වූවන් නිසා කඳවුරු පිරී ඉතිරී ගොස් තිබේ. කඳවුර තුළ පවතින ඒකාකාරීබව හා රැකියාවල යෙදීමේ අවස්ථා අහිමි වීම නිසා වැඩිහිටි පිරිමි පීඩනයට පත්ව සිටිති. මේ තත්ත්වය සමනය කිරීමට කඩිනම් පියවර නොගත හොත් කඳවුරුවල තත්ත්වය දරුණු විය හැකියි. මෙයට එක් පියවරක් සේ වැඩිහිටියන් කිහිප දෙනෙකුට කඳවුර හැර යාමට අවසර ලබා දී ඇත. එසේම රාජ්‍ය නොවන සංවිධාන මගින් දුරකතන පහ-සුකම්, තැපැල් කාර්යාල ආදිය ලබා දී තිබේ. කඳවුරුවල නීතිය හා සාමය පවත්වාගෙන යාමේ අපේක්ෂා සහිතව කඳවුරු නිලධාරීන් සේ තරුණයින් පත් කර ඇත.

### ක්‍රමෝපායන් හා විකල්ප

බටහිර මන්නාරම, උතුරු වව්නියාව ආදී මෑතක දී මුදා ගත් ප්‍රදේශවල විශාල වශයෙන් වල දමා ඇති බිම් බෝම්බ ඉවත් කිරීමට රජය විසින් සැලසුම් සකස් කළ යුතුය. මෙමගින් අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ කටයුතු කඩිනම් කිරීමට මග සැලසෙනු ඇත.

තාවකාලික හැඳුනුම්පත් ලබාදීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ. විභාගවලට පෙනී සිටින සිසු දරුවන් හා රැකියා සොයා යන තරුණයන් සම්බන්ධයෙන් උදෙසා මෙම පියවර ගැනීම ඉතා වැදගත් ය.

අප ගේ වෙබ් අඩවියට පිවිසෙන්න

http://www.humanitarian-srilanka.org/Knowledge_Centre/ Publications.php

මානුෂීය සේවායතන සමූහය විසින් ඉදිරිපත් කරනු ලබන **ක්ෂණික තතු විමසුම** මගින් මානුෂීය සේවා සහ සංවර්ධන කටයුතුවල නියැලෙන ආයතන සිය සැලසුම් සකස් කිරීමේ දී එක් එක් ප්‍රදේශයේ පවතින තත්ත්වය අවබෝධ කර ගැනීමෙන් එම ප්‍රදේශයේ අවශ්‍යතාවන්ට අනුකූලව මානුෂීය සහ සංවර්ධන කාර්යයන් සැලසුම් කර ගැනීමට ප්‍රයෝජනවත් වන තොරතුරු සැපයීමට අපේක්ෂා කරයි.

එමෙන්ම මෙම **ක්ෂණික තතු විමසුම** මගින් අදාල දිස්ත්‍රික්කයන්හි පවතින සාමයට ගොඩනැගීමට හෝ ගැටුම්වලට තුඩුදෙන සංවේදී තොරතුරු නිරාවරණය කරන හෙයින් ආයතනයන්ට එම ප්‍රදේශවල ගැටුම් ඇති නොවන ආකාරයට සහ ගැටුම් අවම කිරීම/සාමකාමී බවට පරාවර්තනය කිරීමට හා සාමය ගොඩනැංවීමට උපරිම අයුරින් දායක විය ආකාරයෙන් කටයුතු කළ හැකිය.

අවදානම් තත්ත්වය තක්සේරු කිරීම මගින් ආයතනයන්ට තම මෙ-හෙයුම් කටයුතුවල නියැලෙන අතර සිය සේවකයන් ගේ සහ එම ආයතන කටයුතු කරන ප්‍රදේශයේ ජනතාව ගේ ආරක්ෂාව ද තහවුරු කිරීමට හැකියාව ලැබේ.

බාහිර පාර්ශවයන් සලකා බැලීමේ දී (පොදු ජනතාවල ජාත්‍යන්තර ප්‍රජාව) සංදර්භ විශ්ලේෂණය මගින් උද්දේශන සඳහා අවශ්‍යය වන ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්කයන්හි පවතින තත්ත්වය පිළිබඳව ප්‍රමාණවත් මෙ-න්ම සමබර තොරතුරු ලබාදෙයි.

මෙම වාර්තාව පිළිබඳව ඔබගේ අදහස් සහ යෝජනා දැනගැනීමට අපි කැමැත්තෙමු. අපගේ ඊ-මේල් ලිපිනය feedback@cha.lk

මානුෂීය සේවායතන සමූහය,
30/81, ලොන්ඩන් පෙදෙස,
කොළඹ 7

දුර/ෆැක්ස්: 94-112506855/2598413